භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2025 මාර්තු - අප්‍රේල් | 126 වන කාණ්ඩය - 02 කලාපය | පිටු 32 | DOP/NEWS/02/2025



# විමුක්තිය

ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# කුක්කු කුක් කු කුකුළා හඬනවා

ගී පද - නිහාල් නෙල්සන්
තනු නිර්මාණය - නිහාල් නෙල්සන්
ගායනය - නිහාල් නෙල්සන්

කුක්කු කුක් කු කුකුළා හඬනවා කුරුලු කොබෙයියෝ ගීත ගයනවා
නිහැඬියාව දැන් හිමින් මැකෙනවා දෙගිඩියාවකින් අපි දිනක් ලබනවා

පත්තරවල විස්තරගොඩ ඇස් ඇරගෙන තත්පරයට අපි කියවනවා
පිත්තල මොළ රත් කරගෙන, දුක්කරදර පැක් කරගෙන දවස ගෙවනවා

වැටක් ගානේ ගෙයක් ගානේ ගමක් ගානේ ලෙඩ මුල් පිටුවේ පුරවලා
කෑම ජාති බීම ජාති බෙහෙත් ජාති හිස්තැන්වලට රිංගලා
කාර් සේල් ඉඩම් සේල් මැෂින් සේල් අන්තිම පිටුවෙ තෙරපිලා
වීර විකුම් මාර කියුම් මැද පිටුවෙන් රජ පුටුවලට වෙන් වෙලා

අනඟ රැඟුම් සරණ බැඳුම් සිතුම් පැතුම් වෙනම ම පිටක ලියවිලා
කවි පබැඳුම් බිතු සිතුවම් කලා කෙරුම් පිටුවක සිත පහන් කළා
යන්තරයෙන් මන්තරයෙන් සූස්තරෙන් කැඩිච්ච දෙපල එක් කළා
ඔයින් මෙයින් දින ගෙවමින් සිහි විකලෙන් මිනිසුන් අතරමං වෙලා

සමාජයේ විවිධ අහුමුලු සියුම් ලෙස සිය ගීතයට හසුකර ගත් අපූර්ව මානවවාදියකු වූ නිහාල් නෙල්සන්ගේ මෙම ගීතය මෙවර තේමාව වන "විමුක්තිය" දෙස වෙනත් ඇසකින් බැලීමට අපව පොළඹවයි. දිනපතා පුවත්පත්වල පළ වන ප්‍රවෘත්ති, දැන්වීම්, ලිපි ආදියෙන් තමා අවට සමාජ යථාර්ථය කියවා ගන්නට ගීත රචකයා දරන උත්සාහය මෙම ගීතයට පාදක වේ.

සිය අතට පත් වූ පුවත්පතේ මුල් පිටුව පුරා සැරිසරද්දී ඔහුට කිසිදු සුබවාදී හෝ යහපත් පුවතක් දක්නට නො ලැබේ. ඒ වෙනුවට ඔහුට හමුවන්නේ සමාජ - ආර්ථික ගැටලු, මිනීමැරුම් හෝ සොරකම් ආදි මනස වියවුල් කරන දෑ ය. ඒ අතර වූ වෙළෙඳ දැන්වීම් පවා පාඨකයාව ලෞකිකත්වය තුළ ගිල්වා තබා ගන්නා අයුරු ඔහු නිරීක්ෂණය කරයි. මැද පිටුවල ඇති දේශපාලන ප්‍රලාප සහ පාරට්ටුවලින් ජනතාව රවටන අයුරු ද ඔහුගේ නෙත ගැටේ. නළුනිළි ඕපාදූප, බොළඳ ප්‍රේම කතා තවත් පිටුවක ය. යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් ආදි මිථ්‍යා මත පැතිරවීමට ද පුවත්පතේ ඉඩහසර ලැබී ඇත. යන්තම් හෝ ඔහුගේ සිත පහන් කරන්නේ කලාව සඳහා වෙන් වී තිබූ එක ම එක පිටුව පමණි. ගීතය අවසානයේ රචකයා සිය අතැ'ති පුවත්පත හරහා තමා අවට සමාජයේ සැබෑ රූපය අප හමුවේ චිත්‍රණය කරයි:

**"ඔයින් මෙයින් දින ගෙවමින් සිහි විකලෙන් මිනිසුන් අතරමං වෙලා"**

මෙය නොවේ ද තිත්ත ඇත්ත? පුද්ගලිකවත්, පවුලක් ලෙසත්, දේශයක් ලෙසත්, අප සොයන්නේ කුමක් ද? අප හඹා යන්නේ කුමක් පසුපස ද? අප සතුට සොයන්නේ කුමකින් ද? අප සැබැවින් ම ජීවිතය විඳිනවා ද, විඳවනවා ද? දිනය පුරා දෙගිඩියාවෙන්, අතරමං ව, පාවි පාවී දිවි ගෙවනවා ද? මේ සියලු ප්‍රශ්න අප හමුවේ ඉතිරි කරන්නට නිහාල් නෙල්සන් සමත් වී ඇත. මෙම ගීතයට කුඩා රැප් කොටසක් එකතු කර තිබීම තවත් සුවිශේෂත්වයකි.

**"පත්තරවල විස්තර ගොඩ ඇස් ඇරගෙන තත්පරයට අපි කියවනවා"**

එම පද යුගලය වේගවත්ව ගායනා කිරීම අහම්බයකින් සිදු වූවක් නොවේ. සිහි විකලෙන් මෙන්, කලබලයෙන් දුවන සමාජ යථාර්ථය ගැන ම නොවේ ද එයින් නොකියා පවසන්නේ? එකල **"තත්පරයට පත්තරය කියවූ"** පරම්පරාවේ වත්මන් පුරුක් සිය ජංගම දුරකථනවල ඉහළ-පහළ යන්නේ ද ඒ කලබලයෙන් ම නොවේ ද? **"පිත්තල මොළ රත් කර ගෙන, දුක්කරදර පැක් කරගෙන"** දවස අසහනයෙන් ගෙවා දැමීම නිමා වන දිනට සැබවින් ම මිනිසා විමුක්තිය සොයා යනු ඇත.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# ශක්ති ප්‍රබෝධනය

2025 මාර්තු - අප්‍රේල්


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

**කවරය නිර්මාණය**

අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**

නිලුමිණ හර්ෂාන්

**මුද්‍රණය**

එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 විමුක්ති දෙව් දහම ... - තීක්ෂණ පෙරේරා

7 සැබෑ ධර්මය - රාෂරා මෙත්මී

8 විමුක්තිය ලබන්නට ... - ශෙලින්ඩා සමරසිංහ

9 විමුක්තිය ලැබගන්නට - පස්කල් ජයමාන්න

10 ලිවීම හා කියවීම ... - මහින්ද නාමල්

12 විමුක්තියේ ස්වාධීන ... - මංගල ජයවර්ධන

13 දොන් ප්‍රැන්සිස් පිලිෂියන් ... - රූපස් ප්‍රැන්සිස්
විමුක්ති මඟට - ලි. හියුබට් ඇ. ප්‍රනාන්දු

14 අපේ සංවාද සංස්කෘතිය - සපුගස්කන්දේ රංජිත්

15 ප්‍රේමය යි, විමුක්තිය යි! - නීටා අයි. ප්‍රනාන්දු

16 විමුක්තිදායකයාණන් ... - සඳුනි වාසනා පීන්තු

17 කෙටි කතාව - තිරිස් දේවකා රත්නායක

20 විමුක්තිය ලැබෙන්නේ මරණින් පසුව ම ද ?
ශාස්ත්‍රපති කපිල ආසිරි පෙරේරා

21 ක්‍රිස්තියානි පවුලේ විමුක්ති කාර්යභාරය
ලැම්බට් හා රෝස් මාලනී යුවළ

22 **Liberation** - Christopher Perera

24 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

25 ඕං එහෙනං - සූරිය මාමා

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 84
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා


28 ප්‍රහේලිකා අංක 82 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාවයි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළ වන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

උත්ථාන වූ ප්‍රතාපවත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුස පත්ව, දුක් විඳ අප හට උදා කළේ සදා නොනිවෙන විමුක්තියේ පහන් සිළුවක් මිස එකෙණෙහි ම පිපී පරවන තාවකාලික විමුක්තියේ අත්දැකීමක් නොව. එය මුළු මනුෂ්‍ය සංහතියට ම තිළිණ කළ අමිල තිළිණයක් වුව ද, වත්මන වන විට ඒ උදාර වූ තිළිණයට උරුමකම් කියන්නට හැක්කේ කීයෙන් කී දෙනෙකුට ද? සියල්ලන්ට ම විවර කළ ඒ අමිල අත්දැකීමට බහුතරයක් දෙනා පා නඟන්නට පැකිළෙන්නේ එහි ඇති අභියෝගාත්මක නිර්මලත්වය නිසාත් තමාගේ වහල්භාවයෙන් මිදෙන්නට ඇති බියත් ඒ වහල්භාවයන්ට ඇති අධික ආශාවත් නිසා ම නොවේ ද? ඉදින් මෙවර කවරයේ කතාව අපට ආරාධනා කරන්නේ සුදත් බලයෙන් බල ගැන්වී පාපිෂ්ඨ වහල් යදම් බිඳ, දෙවිඳුන් උදා කළ සදා විමුක්තියට උරුමකම් කියනු වස් සිටින තැනින් සිටිය යුතු තැනට එතෙර වන්නට ය.

අචල රූපසිංහ


## භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

## BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# විමුක්තිය

## හෙළිදරව්ව

'විමුක්තිය' යන වචනයේ අරුත මිදීම යි. ගැලවීම යි. අප කුමකින් ගැලවිය යුතු ද? කවරකින් මිදීම ලැබිය යුතු ද? බෞද්ධ දර්ශනයට අනුව විමුක්තිය යනු සසර දුකින් මිදීමෙන් ලබන සුවය යි. දේශපාලන විමුක්තිය යනුවෙන් අවබෝධ කර ගන්නේ කවර හෝ ආකාරයක ආක්‍රමණික සතුරන් පලවා හැර ලබන නිදහස ය. කිතුනු දහම අනුව 'විමුක්තිය' අර්ථ දැක්විය හැක්කේ කුමකින් ගැලවීමක්, කවර මිදීමක් සහ කවර අයුරින් නිදහසක් ලැබීම ලෙස ද? නිදහසට වටිනාකමක් ඇති වන්නේ කෙනෙක් හෝ පිරිසක් නිදහසක් නොමැති තත්ත්වයක ජීවත්වන විට දී ය. එය සමාජීය, ආර්ථික, මානසික හෝ ආධ්‍යාත්මික නිදහසක් නොමැති වහල් තත්ත්වයන් වශයෙන් වර්ගීකරණය කළ හැකි ය.

අද බහුතර මිනිසුන් විවිධ වහල්කම් තුළ ජීවිත ගත කරන අයුරු නිරීක්ෂණය කර ගත හැකි ය. මුදල් ඉපයීම ජීවිතයේ එක ම අරමුණ කර ගත් මිනිසුන්ට තම පවුල සමග ගත කරන්නට හෝ දහමට සාධාරණත්වයක් ඉෂ්ට සිද්ධ කරන්නට ඇති ඉඩකඩ ගිලිහී ඇත. ඔවුහු සල්ලි පැටව් ගහන ආකාරය සිහිනෙන් ද දකිති. කාසි එකින් එක ගැටෙන හඬ සිලිං බිලිං හඬින් මේ අයට සිහිනෙන් පවා ඇසෙයි. මුදල් ලැබෙනවා නම් ඕනෑ ම ජඩ වැඩක් පමණක් නොව මිනී මරන්නට ද හැකියාව ඇති අමනුෂ්‍යයන් මේ සමාජය තුළ අපට දැක ගත හැකි ය.

මනුෂ්‍ය දුර්වලකම් අතර තණ්හාව ප්‍රධාන පෙළේ අවගුණයකි. කොපමණ ලැබුණත් සෑහීමකට පත් නො වන දුර්ගුණය නිසා ම අද ඇතැම් අය සූදුව ව්‍යාපාරයක් කරගෙන ඇත. බූරුවා ගසන්නේ ගමේ ගොඩේ දුප්පත් මිනිසුන් ය. මුදල් ඇත්තෝ කැසිනෝ රේස් බයි රේස් වැනි ව්‍යාපාර සොයා යන්නෝ ය. ඒවා නීතියෙන් ද අනුමත කර ඇත. යථාර්ථය දිනනවාට වඩා පරදිනවා ය. මෙහි න්‍යාය වන්නේ තමන් මහන්සියෙන් හම්බ කර ගත් මුදල තණ්හාව නිසා අහිමි වේ. පඩි පැකට් එක සම්පූර්ණයෙන් ම සූදු පොළට දී හිස් අතින් නිවසට යන මිනිසුන් අපට හමු වේ. ඔවුන් පසුතැවිලි වුවත් මුදල් ලැබුණ විගස නැවතත් ඒ දෙසට ම ගමන් කිරීම මෙහි ඇති බරපතළ වහල්කම ය. එයින් මිදෙන්නට තරම් අවබෝධයක් සහ ශක්තියක් මේ අය සතු නො වීම මෙහි ඛේදවාචකය යි. ඔවුන්ගේ දරු පවුල් අනාථ වී අසරණ වී දරිද්‍රතාවට පවා මෙවැන්නන් තල්ලු වී ඇත.

මත් කුඩුවලට, මත් වතුරට, දුම්බීමට ඇබ්බැහි වූ විශාල ජනතාවක් අද අප අතර ඇත. කිසිදු පාලනයකින් තොරව නිරායාසයෙන් තමන් එවැනි දේ සඳහා නිතර ම යොමුවන්නේ නම් එය ඇබ්බැහිවීමේ ලක්ෂණයකි. ඕනෑ ම දෙයකට ඇබ්බැහි වන්නා එහි වහලෙකු බවට පත් වේ. මංගල්‍යයට අවමංගල්‍යයට, හමුවීමේ දී සමුගැනීමේ දී, විනෝද ගමනේ මෙන් ම වන්දනා ගමනේ දී, සීතලට හෝ උණුසුමට, සතුටට හෝ දුකකට මේ ඕනෑ ම අවස්ථාවක මේවාට යොමු වීම නිසාම තමන්ටත් හොරා එය හුරු පුරුදු ක්‍රියාවක් බවට පත්වූ විට ඔහු හෝ ඇය එහි වහලෙකි. ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේ වහල්කම නිසා දුක් විඳිති. ඔවුන්ගේ දරු පවුල් අන්ත අසරණ වී ඇත. සමාජීය, සෞඛ්‍ය, ආර්ථික සහ ආධ්‍යාත්මික වශයෙන් මේ අය දුබල වී අසරණ වී පිරිහී ඇතත් ඒ සඳහා පිළියම් සෙවීමට බොහෝ දෙනා උනන්දුවක් සහ උත්සාහයක් නො ගනිති. මෙවැන්නන්ට විමුක්තිය අත්‍යවශ්‍ය නැද්ද?

සමහරුන් විලාසිතාවන්ට ද, තවත් සමහරුන් තොරතෝංචියක් නැතිව කථා කිරීමට ද හුරුපුරුදු වී ඇත. වගකීමකින් තොරව කථා කරන ඇතැමුන්ගේ කටවලට බ්‍රේක් නැත. නො කිවයුතු දෑ පවා පවසන්නට ගොස් අනවශ්‍ය රණ්ඩු සරුවල්වලට ද පැටලෙන හැටි දැක ගත හැකි ය. "හොඳට නරකට දෙකට කට ම ය" කියන්නේ ඒ නිසා ම ය. "රට වට කර වැට බැන්දත් කට වට කර වැට බඳින්නට නො හැකි" යැයි පැවසුවේ අසංවර වචන භාවිත කරමින් තමන්ගේ විමුක්තිය තමන් විසින් ම අහිමි කර ගන්නා අය නිසා ම ය.

ස්මාට් ජංගම දූරකථන, රූපවාහිනී, ලැප්ටොප් ඇතුළු නවීන තාක්ෂණික මෙවලම් තුළින් ලබා ගත හැකි යහපත් දෑ අපමණ ය. අවාසනාවකට ඊට වහල් වී ජීවිත විකෘත කර ගත්, විශේෂයෙන් ම දූ දරුවන් ද ඇතැම් වැඩිහිටියන් ද අද අපට හමු වේ. මෙවන් වහල්කම් සහ ඇබ්බැහි වීම්වලින් මිදෙන්නට එතරම්

පහසු නැත.

අසම්මත ලිංගික චර්යාවන්ට පෙලඹීම අද බහුලව වී ඇත. ඒ නිසා විශේෂයෙන් ම පවුල් ජීවිතය අවුල් කරන්නට, දරුවන් අනාථ කර හැර දමා යන්නට මේ වහල්කම අද පවුලට තර්ජනයක් වී ඇත. දරු පවුල් විනාශ කරන මෙවැනි දෑ දැවෙන ප්‍රශ්නයක් වී හමාර ය. පෙරට වඩා නූතන සමාජ පසුබිම ඒ සඳහා අවස්ථා උදා කර දීම නිසා ම මේවාට ඇබ්බැහි වී වහල් වීම නිසා ම කොපමණ මුදල් හම්බ කළත් ප්‍රමාණවත් නො වන අතර පවුලේ අභිමානය, එකමුතුකම, ගෞරවය, සදාචාරය පිරිහී විනාශ වන්නේ එවැනි දෑ සඳහා ම වහල් මානසිකත්වයක් සමහරුන් හදාගෙන ඇති නිසා ය. ඉන් බැහැර වන්නට කිසිදු උත්සාහයක් නො ගන්නා අය එමට ය.

අද සමාජයේ ඇති තරගය නිසා මඟුලට අවමඟුලට ඇතුළු විවිධ අවස්ථාවන් සඳහා තමන්ට දරා ගත නො හැකි මුදලක් ණයට ගෙන වියදම් කරති. ආදායමක් නොමැතිව වියදම් කිරීමට තමන් පෙලඹීම නිසා ණය වනවා පමණක් නොව නිදහස් සාමකාමී ජීවිතය තමන්ට අහිමි වේ. එලෙස ණය වූ අය වසර ගණනාවක් ණය ගෙවා ගන්නට අසමත් වී තමන්ගේ විමුක්තිය තමන් විසින් ම අහිමි කරගෙන අම්හිරි ජීවිත ගත කරති. තමන් දුක් මහන්සියෙන් හම්බ කර ගත් මුදල් සකසුරුවම් ක්‍රමයකට වියදම් කළ යුතු බව ඇතැම් අයට අදහසක් නැත. අවබෝධ කර ගන්නේ ද නැත.

තමන්ට හිතැති දේශපාලන පක්ෂය කුමන ආකාරයේ අපරාධ කළත්, රට බංකොලොත් කළත්, අනීතික ලෙස රටට නොගැළපෙන විවිධ ක්‍රියාකාරකම්වල නියැළී තිබුණත්, ඒවා අපරාධ ලෙස නො දකින්නෝ වනාහි වහල් මානසිකත්වයෙන් හෙබි පාක්ෂිකයෝ හැර අන් කවරහු ද?

එක්තරා තරුණයෙකු ප්‍රේම සම්බන්ධතාවක් ආරම්භ කර තිබුණ ද ඔහුට නීතිවිරෝධීව ඕස්ට්‍රේලියාවට යාමට අවස්ථාවක් මීට වසර ගණනාවකට පෙර ලැබුණි. එබැවින් වසර පහක් ගිය ද ලංකාවට ඒමට හැකියාව අහිමි වුණේ නීත්‍යානුකූල ලියවිලි ඒ වන විටත් හෙතෙම ලබා නොගත් නිසා ය. වසර ගණනාවකට පසු ඕස්ට්‍රේලියාවෙන් නීත්‍යානුකූලව ඔහුට අවශ්‍ය ලියකියවිලි ලැබුණ විගස ම ඔහු ලංකාවට පැමිණියේ තම පෙම්වතිය සමග විවාහ වන්නට ය. එහෙත් ඔහුට දැන ගන්නට ලැබුණේ තමන්ගේ පෙම්වතිය වෙනත් පෙම්වතෙකු සමග විවාහ වන්නට තීරණය කර හමාර බව ය. කෙසේ හෝ මේ තරුණයා තමන්ගේ පෙම්වතියට පැවසුවේ ඉන් බැහැර වී තමන් සමග එකතු වන ලෙස ය. එහෙත් එය කළ නො හැක්කක් බව ඇය පැවසුවා ය. අනතුරුව මෙම තරුණයා නොකා නොබී හුදකලාවේ සතියක් පමණ ජීවත් වී ලිපියක් ලියා තම නිවසේ ම එල්ලී මළේ ය. ප්‍රේම සම්බන්ධතාවල ඇති ස්වරූපය සහ යථාර්ථය නිසි අයුරින් අවබෝධ කර නො ගෙන තම ජීවිතය පවා ඇතැම් අය අවදානමට දමා තමන් එහි වහලෙකු වී විමුක්තිය අත්දකින්නට නො හැකිව තමන්ගේ වටිනා ජීවිතය විනාශ කර ගැනීම ඛේදවාචකයක් නො වන්නේ ද?

ජේසුස් වහන්සේ මෙලොවට පැමිණෙන්නේ මනුෂ්‍යයන්ට මෙවැනි විවිධාකාර වහල්කම්වලින් මුදා විමුක්තිය ලබා දීමට ය. "**ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යයි උන්වහන්සේ පවසන සේක" (ජොහාන් 8:12).** එදා සමාජයේ තිබුණා වූ විවිධාකාර යදම් නිසා ජනතාව පීඩනයට පත් වී හෙම්බත් වී කලකිරී සිටියහ. එය විටෙක බදු බර ය. තවත් අවස්ථාවක ආගමික වත් පිළිවෙත් සහ දරන්නට නො හැකි නීති රීති ය. තවත් අවස්ථාවක රෝගීන්ට, පව්කාරයන්ට, වැන්දඹුවන්ට, අනාථයන්ට, අසරණයන්ට, දිළිඳුන්ට තව තවත් ඔවුන්ගේ පීඩනය වැඩි කරන සමාජ පරිසරයකි. මේ සියල්ල නිවැරදිව අවබෝධ කර ගත් සමිඳාණන් වහන්සේ උන්වහන්සේ වෙතට එන ලෙසට තැළෙන පෙළෙන ජනතාවට ආරාධනා කළ සේක. "**වෙහෙස වන බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න; මම ඔබට සහනය දෙමි. මා ගුණවත්, මෘදු නිහතමානී කෙනකු බැවින් මාගේ වියගහ කරට ගෙන මාගෙන් ඉගෙන ගන්න" (මතෙව් 11:28-29).** එදා දේව දූතයා ක්‍රිස්තු උපත ගැන එඬේරුන්ට පවසන්නේ "**සමිඳාණන් වන ක්‍රිස්තුස් නම් ගැලවුම්කරුවෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේ ය" (ලූක් 2:11).** අපගේ ගැලවුම්කරුවාණන් ලෙස ක්‍රිස්තුස් වහන්සේ පිළිගෙන දේව වචනයට සුසර වන ඕනෑ ම ක්‍රිස්තු ශ්‍රාවකයකුට ක්‍රිස්තුන් වහන්සේ ගෙනෙන විමුක්තිය අයිති කරගන්නට වරම් ලැබේ. එවිට ඔහු හෝ ඇය ලෝකය විසින් දෙන්නට බැරි, මුදලට ගන්නට නො හැකි සැබෑ විමුක්තිය, සැබෑ නිදහස අත්දකින පුද්ගලයකු වනු ඇත. ධර්මය පිළිපදින්නා ධර්මය විසින් ආරක්ෂා කරනු ඇත.

**සංස්කාරක පියතුමා**

# විමුක්ති දේව දහම හා එහි විකාශය

ලෝකයේ අද පවතින ආගම් සියල්ලක් ම පාහේ සංවිධානගත ආගම් ය. කතෝලික දහමෙහි, බුදු දහමෙහි, ඉස්ලාම් දහමෙහි ප්‍රධාන ශාස්තෲවරු වන ජේසුස් වහන්සේ, බුදුන් වහන්සේ හා නබි තුමන් වැනි මහා පුරුෂයන් ඉදිරිපත් කළ ධාර්මික ඉගැන්වීම් ඔවුන්ගේ නව සොයාගැනීම් නොව ඔවුන් ජීවත් වූ ප්‍රදේශ ආශ්‍රිත මිනිසුන්ගේ ජන ජීවිතයෙන් අවබෝධ කරගත් විවිධ ධර්මතාවල මෙනෙහි කිරීමක ප්‍රතිඵලයක් හා පොදු උරුමයක් ලෙස ඉදිරිපත් කළ කරුණු වේ. ඒ අනුව ලෝක ධර්මතා පිළිබඳ අවබෝධය හෙවත් ධර්මය සංවිධානගත ආගම්වලට වඩා ඉපැරණි වන සේ ම ලේබලයකින් තොර වූ මානව උරුමයකි. නමුත් සංවිධානාත්මක ආගම් විසින් ධර්මය යම් ලෙස කොටු කිරීමකට පත් කොට ඇත. විශ්වය තුළ මානව වර්ගයාගේ පුද්ගලික වූත් පොදු වූත් විමුක්තිය රැඳී තිබෙන්නේ ධර්මය අනුව ජීවත් වීම තුළ ය. එහෙයින් ධර්මය විමුක්තිදායක ය.

කිතු දහම සකල මැවිල්ලේ විමුක්තිය අරමුණු කොට ගත් දහමකි. බයිබලයට අනුව ඉශ්රායෙල් ජාතිකයන් ඔවුන්ගේ දෙවියන්ව ලෝක ඉතිහාසය තුළ මුල් වරට අත්දකින්නේ නික්මයාම සිද්ධිය තුළ යි. එනම් මිසරයේ පාරාවෝගේ වහලුන් ලෙස සිටි ජනයා එම වහල් බවින් මිදී නිදහස්, නිවහල්, සාධාරණ, ස්වයංපෝෂිත දේශයක් කරා ගිය විමුක්ති ගමන යි. එහි දී මිනිසුන් තම දෙවියන් අත්දකින්නේ එතෙක් ලොව මැවූ දෙවියන් යන සංකල්පයෙන් නොව ඔවුන්ව වහල් බවින් මුදවා ගත් දෙවියන් ලෙස යි. කිතු දහමේ කේන්ද්‍රීය සිදුවීම ද මෙය යි. නව ගිවිසුමේ ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවර වූයේ ද උන්වහන්සේ ජීවත්ව සිටි සමාජයේ පැවති සියලු පීඩාකාරී ව්‍යුහයන්ට එරෙහිව පීඩිතයාගේ පැත්තේ සිට සමස්ත ජනයාගේ විමුක්තිය උදෙසා ක්‍රියා කිරීම යි. ජේසු සමිඳාණන් ඉගැන්වූ විමුක්තිය නිසා හැඬීම්, වැලපීම්, පීඩාව, ඝාතනය නැති කර විෂමතාව නැති කරන, සමානාත්මතාව, ප්‍රේමයේ සමාජයක් බිහි වීම තුළ අත්දකින විමුක්තියකි. එසේ නම් කිතු දහම යනු නික්මයාම මඟින් අත්දැකීමක් බවට පත් වූ ඉශ්‍රායෙල්වරුන් ඇසුරින් ගොඩනැගුණු ක්‍රිස්තුස් වහන්සේ විසින් විශ්වයට විවෘත කරන ලද විමුක්ති ධර්මය යි. විමුක්ති මාර්ගය යි.

ශු. බයිබලයේ දෙවියන් හා ඉතිහාසය යන තේමාවන් ද්විත්වය යි. දෙවියන් පිළිගැනීම සියල්ලන්ට ම සිදු කිරීමට නො හැකි වුව ද සියලු දෙනාට ඉතිහාසය පිළිගත හැකිය. කිතුනුවන් ඉතිහාසය දෙස බලන්නේ ගැලවීම හෙවත් විමුක්තිය තුළ පිහිටා ය. ඒ නිසා ඔවුන් ඉතිහාසය ගැලවීමේ ඉතිහාසය ලෙස හඳුන්වයි. එලෙස ම ඔවුන් ඉතිහාසය විශ්වාසයේ දෑසින් බලයි. එනම් ඉතිහාසයේ විමුක්තිදායක ගමන මෙහෙයවන්නේ දෙවියන් යන විශ්වාසය යි.

ක්‍රිස්තුස් වහන්සේ දේශනා කළ ධර්මය විවිධ අර්ථකථනවලට ලක් කරමින් ගොඩ නැංවූ දහම් සම්භාරය දේව ධර්මය නම් වේ. පසු කාලීනව නොයෙක් දේව ධර්ම ශාස්ත්‍රවරු ගොඩනැඟූ දේවධර්මය එහි සැබෑ විමුක්ති හරය සැඟවුව ද ඇතැම් අවස්ථාවලදි ඊට හාත්පස පිටුපා විෂමතාවය, වහල්භාවය පවත්වාගෙන යාමට ක්‍රියාත්මක වන ධර්මයක් ලෙස වර්ධනය වී තිබේ. පුනරුද සමයේ දී සභාව නැඟී එන ධනපතිවාදය සමග කඳවුරු බැඳ ගැනීම මඟින් ලෝකයේ බහුතරයක් දුප්පතුන් බවට පත්කර ඉපැරණි ශිෂ්ටාචාර විනාශ කිරීමෙහිලා අධිරාජ්‍යවාදයේ කොටස්කරුවකු විය. මෙය ක්‍රිස්තු ධර්මයට සපුරා පටහැනි තත්ත්වයකි. වාණිජවාදය සමග නැඟී ආ බටහිර අධිරාජ්‍යවාදය ලොව පුරා පැතිර යමින් ආසියාව, අප්‍රිකාව, ලතින් ඇමෙරිකාව ආදි ප්‍රදේශවල සම්පත් කොල්ලකමින් යුරෝපය තුළ ධනය ගොඩගසන ලදී. මේ තත්ත්වය තුළ කම්කරුවෝ දෙව් මැඳුරුවලින් ඈත් වූහ. වර්ධනය වන මෙම තත්ත්වය තුළ ගොඩනැගුණු පීඩනයට සභාව තුළ පිළිතුරක් නොමැති වීම සහ සන්දර්භය තුළ 'ආගම අබිං' යන ප්‍රකට කියමන ගොඩනැගුණි.

තම පැවැත්ම රැක ගන්නට හෝ මෙම තත්ත්වයට ප්‍රතිචාර ලෙස 1891 දි 13 වන ලියෝ පාප්තුමන් "වෙහෙසෙන මිනිස්සු" (Rerum Novarum) නමින් ප්‍රකාශනයක් නිකුත් කරන ලදී. 3 වන ශත වර්ෂයෙන් පසු බරපතළ වසා දැමීමකට

ලක්ව තිබූ ක්‍රිස්තියානියේ සමාජ, ආර්ථික, දේශපාලන දර්ශනය යන්තම් හෝ මෙයින් කලඑළි බැස්ස ද සභාවේ පැවති අධිරාජ්‍යගැති වාදය සමග කිතු දහමේ විමුක්ති හරය තුලනය කිරීමට නො හැකි වීම මෙම තත්ත්වය පසුබෑමට ලක් කළේ ය. රෙපරමාදු සභා මෙම තත්ත්වයට ප්‍රතිචාරය දැක්වීමට ප්‍රකාශ නිකුත් කිරීම මත ලෝක ක්‍රිස්තියානි සමුළුවට පදනම වැටුණි. ඔවුන්ගේ යටිපෙළ අදහස වූයේ ද තම පැවැත්ම ස්ථිර කර ගැනීම සහ ලෝකය ම ක්‍රිස්තියානි කිරීම යි. මෙලෙස ඔවුන්ගේ ප්‍රයත්නය ද ප්‍රමාද වී ආ සුබ පැතුමක ස්වරූපය ගත්තේ ය.

ක්‍රිස්තියානි සභාවක්, නව අහස හා පොළොව බිහි කිරීම වෙනුවට පවතින රාජ්‍ය ප්‍රතිසංස්කරණ පවත්වා ගැනීමට කටයුතු කිරීමෙන්, ධනවාදයේ පීඩනය කම්කරු හා ගොවි ප්‍රජාවට දරා ගැනීමට අපහසු වීමත් මාක්ස්වාදයේ බලපෑම ලොව පුරා විසරණය වීමට හේතු පාදක විය. 1917 රුසියානු විප්ලවය ධනවාදයට එරෙහි පීඩිත ජන කොටස්වල නැඟී සිටීම කඩ ඉමකට ගෙන එන ලදී. අධිරාජ්‍යවාදයට එරෙහි උද්ඝෝෂණ ලොව පුරා පැතිරීමත්, ජාතික විමුක්ති ව්‍යාපාර, යටත් විජිත රටවල ව්‍යාප්ත වීමත් මේ සමග ඇරඹිණි. එහි බලපෑම ශ්‍රී ලංකාවට ද බලපෑවේ 20 වන සියවස මුල් භාගයේ දී මාක්ස්වාදී අදහස් ලංකාවට පැමිණීමත් සමග ලංකා සමසමාජ පක්ෂය පිහිටුවීම යි.

මෙලෙස ලොව පුරා අධිරාජ්‍යවාදයේ බිඳ වැටීමත් හමුවේ ක්‍රිස්තියානියට ද තම පැරණි වැඩවසම්වාදී අධිරාජ්‍යවාදී රෝමානු හා බටහිර අධිරාජ්‍යවාදී ස්වරූපයෙන් ඉදිරියට යාමට නො හැකි බව පසක් විය. ක්‍රිස්තියානියේ සැබෑ විමුක්ති හරය ගැන සිතුවෝ ජනතාවගේ විමුක්තිය උදෙසා සභාව වෙනස් විය යුතු බව ප්‍රකාශ කළහ. තම පැවැත්ම සඳහා හෝ මෙම වෙනසක අවශ්‍යතාවට ප්‍රතිචාර දැක්වීමට මුල් පියවර ගත්තේ ද රෙපරමාදු සභාවන් ය. ඒ 1948 ලෝක ක්‍රිස්තියානි සමුළුව මඟින් සභාවන් ජනතාවගේ සභාවන් විය යුතු බව හා දේශයට ගැළපිය යුතු බව ප්‍රකාශ කිරීම මඟිනි.

කතෝලික සභාව තුළ මෙම වෙනසක අවශ්‍යතාව තදින් ම දැනුණේ ඇමරිකානු ආධිපත්‍යයේ ඍජු බලපෑමෙන් හා අධිරාජ්‍යවාදීන් කළ විනාශය මඟින් විශාල පීඩාවකට පත් වූ ලතින් ඇමරිකානු සභාවට ය. ආසියාව තුළ එවන් වෙනසකට අවශ්‍යතාව නො දැනුණේ ක්‍රිස්තියානිය එහි සුළුතරයක් වූ නිසා ය. මෙලෙස ලතින් ඇමෙරිකානු අවශ්‍යතාව 1955 ඇරඹුණු ලතින් ඇමෙරිකානු රදගුරු සමුළුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. සභාව මාක්ස්වාදය කෙරෙහි ඇතිකර තිබූ බිය අභිභවා යමින් මාක්ස්වාදී න්‍යායයෙන් අධ්‍යනයට හා භාවිතයට ගැනීමේ ප්‍රවණතාවක් ලතින් ඇමරිකාව පුරා ඇති වීමත් සමග එවකට පාප් ධූරය හෙබවූ 23 වන ජුවාම් පාප්තුමන් II වන වතිකානු කතිකාව 1961-64 වසරවල කැඳවන ලදී. එහි ප්‍රධාන ප්‍රකාශනයක් වූ "Gaudium et spes" (ආනන්දය හා අපේක්ෂාව) නම් ප්‍රකාශනය මඟින් එතෙක් පැවති වැඩවසම් අධිරාජ්‍යගැති අධිපතිවාදී සභා දැක්මේ වෙනසක් සිදු විය. මුල් ක්‍රිස්තියානියට යාමට එය ආරාධනා කළේ ය. දේශයට හා කාලයට ගැළපෙන ක්‍රිස්තියානියට දොර කවුළු විවර කළේ ය.

ලෝක ක්‍රිස්තියානි සභා සමුළුව හා කතෝලික සභාවේ ලිපි ලේඛන, සංදේශ, සමුළු නිර්දේශ හරහා මතු වූ ක්‍රිස්තියානි සමාජ දර්ශනයන් මාක්ස්වාදී විග්‍රහයේ බලපෑමත් එකතු කර බයිබලයේ සැබෑ හරය හෙවත් විමුක්ති හරය මතු කර ගැනීමේ ව්‍යාපාරය, 'විමුක්ති දේව ධර්මය' ලෙස නාමකරණය විය. 1970 දශකය තුළ 'විමුක්ති දේව ධර්මය' ලොව පුරා ප්‍රචාරය වූයේ 1973 දී විමුක්ති දේව ධර්මයේ පියා ලෙස සැලකෙන 'ගුස්ටාවෝ ගුටියෙරෙස්' ලියූ 'විමුක්ති දේව ධර්මය' නැමැති පොත මඟිනි. ආසියානු, අප්‍රිකානු, ක්‍රියාවේ, තුන්වන ලෝකයේ ආදි මහද්වීපවල දේව ධර්මය විවිධ පැතිකඩ ඔස්සේ එය සාකච්ඡාවට බඳුන් විය.

ඒ වන විට ශ්‍රී ලංකාව තුළ ද විමුක්ති දේව ධර්මය සාකච්ඡාවට හා ක්‍රියාවට නැඟෙමින් පැවතුණි. 1976 වසරේදී විමුක්ති දෙවි දහම් කීර්තිධරයන් වන ගුස්ටාවෝ ගුටියාර්ස්, සර්ජියෝ ටොරස් වැන්නන් සමග ජාත්‍යන්තරව විමුක්ති දේව ධර්මය ප්‍රචලිත කිරීමේ වැඩපිළිවෙළක හවුල්කරුවකු වීමට තුන්වන ලොව දෙවි දහමේ ගුරු ලකුණ යන විරුදාවලිය ලත් ගරු. තිස්ස බාලසූරිය පියතුමන්ට හැකි විය. තවද ගරු. ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා මුල් කර ගෙන

'ආසියානු දේවධර්ම සම්මේලනය' බිහි වන්නේ ද මෙම යුගයේ ය.

ඇමරිකාව ප්‍රමුඛ ධනවාදී කඳවුරේ දුෂ්ට පහර දීම් හා සමාජවාදයේ ඇතැම් අඩුපාඩු හමුවේ රුසියානු සමූහාණ්ඩුව බිඳ වැටීමෙන් නව ගෝලීය ධනවාදයේ ව්‍යාප්තිය 1980 දී ආරම්භ විය. ඒ සමග ම සභාවන් තුළ නැවත විමුක්තිදායක නැඹුරුව පරිධියට තල්ලු වෙමින් ගෝලීය ධනවාදයට යොමු ව තම පැරණි පුරුදු ගමන් මඟට ම නැඹුරු විය. 1984 දී එවකට කාදිනල් රැට්සිංගර්, ස්වර්ගස්ථ වී වදාළ 16 වන බෙනඩික් පාප්තුමන් විමුක්ති දේව ධර්මයට විවේචනාත්මක ප්‍රකාශයක් නිකුත් කරන ලදී. අසූව දශකයේ අග භාගයේ දි එම ප්‍රකාශය ගැන ලංකාවේ අම්පිටිය ජාතික දෙව්සත්හලේ පූජක සිසුන්ට ඉගැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස විමුක්ති දේව ධර්මය ගැන ඇතැම් සහෝදරතුමන්ලා උනන්දු වූහ. ඒ අතර ශ්‍රී ලාල් අමරතුංග, ජයන්ත පින්නවල, ශෙරාඩ් ජයවර්ධන වැනි පියතුමන්ලා වූහ. ඊට පෙර සිට ද මයිකල් රුද්‍රිගෝ, තිස්ස බාලසූරිය, හිලේරියන් දිසානායක, මේරි බැස්ටියන්, ඇලෝසියස් පීරිස්, සරත් ඉද්දමල්ගොඩ, අබා කොස්තා, ලියෝ නානායක්කාර වැන්නවුන් විමුක්ති හරය ඔස්සේ පීඩිත ජනයාගේ පැත්තේ සිටිමින් ශ්‍රී ලාංකීය සභාව තුළ නවෝදයක් ඇති කිරීමට වෙර දැරූ දිවි පිදුවෝ වූහ. විමුක්ති හරය ජීවත් කරවන ඕනෑ ම අයකුට තර්ජන ගර්ජන, සීමා වාරණවලට යටත් වීම්, ජීවිතය පවා පුද දීමේ සම්භාවිතාව වැඩි ව පවතී.

ඒ අනුව 1970 - 80 දශකවල ශ්‍රී ලංකාවේ කතෝලික ධර්මගුරුන්, විශේෂයෙන් ජාතික හා ජාතිකත්වයන් පිළිබඳ අසාධාරණතාවලට ප්‍රතිචාර දැක්වීමට සහ සමාජීය සමානතා, සාමය හා නිදහස ලබා දීමට පිළිවෙලින් ක්‍රියා කළහ. 1971 1983 හා 1989 වැනි අවස්ථා ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වශයෙන් විශාල සංචලනයකට මඟ පෙන්වූයේ ය. එවක විමුක්ති දෙව් දහමේ මූලික අදහස ද "පීඩිතයන්ගේ නිදහස" හා "සාමකාමී සමාජයක්" නිර්මාණය කිරීම පිළිබඳව වැඩි අවධානයක් ලබා ගත්හ.

අදත් ශ්‍රී ලංකාවේ කතෝලික හා ක්‍රිස්තියානි සංවිධාන, විශේෂයෙන් ගම්මාන ප්‍රදේශවල සමාජීය හා ආර්ථික අසාධාරණතා අඩු කිරීමට උත්සහ කරති. සමාජ සාධාරණත්වය මත පදනම්ව මධ්‍යම හා දකුණු ශ්‍රී ලංකාවේ පීඩිතයන්ට සහය ලබා දීමෙහි ක්‍රියා කරනු ලබයි. සභාව තුළ ද කරිටාස් ආයතන හරහා පීඩිත ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා විශාල මෙහෙවරක් කරනු ලබයි. සමාජීය හා සාමයික කේන්ද්‍රය (CSR) මඟින් ද විවිධ අසමානතා, අසාධාරණතා ගැන පාලකයින්, බලධාරීන් හා ජනතාව අවදි කරනවා පමණක් නොව සාධාරණ සමාජයක් නැත්නම් මිහිපිට දේව රාජ්‍යය තැනීමෙහිලා කටයුතු කරනු ලබයි.

මූලාශ්‍ර : 'කිතුසර' ප්‍රකාශනයක් ඇසුරින්

**තීක්ෂණ පෙරේරා**
ශ්‍රී හෘදයේ ආධුනිකාරාමය,
බණ්ඩාරවෙල.

# සැබෑ ධර්මය

මුව දෙනකට වනයේ පවස නිවා ගැනුමට
දිය දහර අවශ්‍ය වන්නා සේ
මිනිසා හට ද තම ආත්මික පිපාසය
සංසිඳුවා ගැනීමට ආගම අවශ්‍ය වේ.

කිතු සමිඳුන් එක් මොහොතක දී
පුද්ගල සිතුවිලි හා බුද්ධියේ සියුම් තැන්
විමසන අතර ඉන් සැඟවීමට හැකි ද?
කවරෙකු හට නූතන සමාජයේ
ආගම යොදා ගනු ලබන්නේ වාසියට ය.
තම දුර්වලතා වසා ගැනීමට ය.

නමුත් සැබෑ ධර්මය වනාහි ජීවත් වීමකි,
කැඩීමකි, වැය වීමකි,
කැපවීමකි, බිඳීමකි,
ආත්මයන් නිරාගින්නෙන් මිදීමට මැදිහත්
වීමකි.

**රාෂරා මෙත්මී**
මොරටුව

# විමුක්තිය ලබන්නට සැරසෙමු...

මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ලොවට විමුක්තිය ලබා දෙනු වස් තම ඒක ජනිත පුත්‍රයාණන් මෙලොවට එවා වදාළ බව අප සැම විශ්වාස කරනු ලබන්නකි. එහෙත් සැබැවින් ම අප විමුක්තිය හෙවත් ගැලවීම ලබා ඇත්ද යන ප්‍රශ්නයට කතෝලිකයන් වන අප සැමට පිළිතුරක් ලබා දිය හැකි ද යන්න දෙවරක් සිතා බැලිය යුතු කරුණකි. එසේ නම් සැබැවින් ම විමුක්තිය ලබා ගැනීම හෙවත් ගැලවීම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද යන්නත් අප විමුක්තිය ලබා ගත යුත්තේ කුමකින් ද යන්නත් පළමුව විමසා බලමු.

පාපය යනුවෙන් සරලව හඳුන්වනු ලබන්නේ දේව කැමැත්තට පටහැණිව ක්‍රියා කිරීම යි. දෙවියන් වහනසේ විසින් ලෝකය කිසිදු දුකක් වේදනාවක් නොමැතිව මවන ලද අතර අපගේ ආදි මවුපියන් වන ආදම් සහ ඒව දේව අණට විරුද්ධව කළ පාපය කරණ කොට ගෙන දුක, වේදනාව, මරණය හිමි වූ අතර දේව වරම් සහ ස්වර්ග රාජ්‍යය ද අහිමි විය. මෙලෙස පාපය ලෝකයට පැමිණියේ ඒදන් උයනේ දී වන අතර ආදම් සහ ඒව කළ පව් ඔවුන්ගේ පරම්පරාව ද අනුගමනය කරන ලදී. මේ නිසා අප සැම උපදින්නේ ජන්ම පාපයත් සමග ය.

එසේ වුව ද දෙවියන් වහන්සේ මිනිසාට අසීමිතව ප්‍රේම කළ නිසා ඔවුන් කළ පාපය කරණ කොට ගෙන ඔවුන්ව අත් නොහැරිය සේක. ඒ බව ශු.බයිබලය විග්‍රහ කරනු ලබන්නේ මෙසේ ය. "දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාට විනාශ නොවී සදාතන ජීවිතය ලබන පිණිස ය" (ජොහාන් 3:16). මන්දයත් ආදි මවුපියන් සිදු කළ පාපය දේව අපහාසයක් වන අතර එවැනි දේව අපහාසයකට වන්දි ගෙවීම සාමාන්‍ය මිනිසෙකුට කළ හැකි දෙයක් නොවේ. මේ නිසා දේව සමානකමක් ඇති ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මේ සඳහා ඉදිරිපත් වූ අතර උන්වහන්සේ මිනිසත් බව ගෙන දිළිඳු ගවහලක උපත ලැබුවේ පව්කාර වූ අප සැමට විමුක්තිය දානය කරනු සඳහා ය. මෙය සනාථ කරනු වස් "ඈ පුතෙකු බිහි කරන්නී ය. උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතු ය; මන්ද, සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ උන්වහන්සේ ය." (මතෙව් 1:21) යන බයිබල් පාඨය ගෙන හැර දැක්වීම සුදුසු ය.

ජේසු සමිඳුන් මෙලෙස මෙලොවට වැඩිය පසු තමාගේ මුළු ජීවිත කාලය පුරා සදාතනික ජීවනය ලබා ගත හැකි මාර්ගය මිනිසුන්ට පහදා දුන් සේක. ශු. ලූක් සුබාරංචිය දක්වන පරිදි "දිළිඳුන් හට සුබාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක" (ලූක් 4:18) යැයි ජේසුස් වහන්සේ ප්‍රකාශ කොට තිබේ. මේ නිසා උන්වහන්සේ තම ජීවිත කාලය තුළ පව්කාරයන්ට දැඩි කරුණාවක්, ප්‍රේමයක් දැක්වූ අතර ඔවුන්ට තම පාපයන්ට විමුක්තිය ලබා ගැනීමේ මඟ තම වචනයෙන් මෙන්ම ක්‍රියාවෙන් උගන්වා ප්‍රාතිහාර්යයන් මඟින් ඒ බව සනාථ කළ සේක.

මෙලෙස ලොව මිදුම්කාර විමුක්තිදායකයාණෝ සුපුවත දේශනා කරමින් විමුක්තිය ලබා ගැනීමේ මාර්ගය හෙවත් ස්වර්ගයට දොරටු විවර කරගන්නා මාර්ගය පහදා දුන්හ. ගුරුවරයකු ඉගැන්වූ පමණින් අධ්‍යාපනය යන ක්‍රියාවලිය සම්පූර්ණ නොවේ. දරුවා ද එම ඉගෙනුම් ක්‍රියාවලියට සක්‍රීයව දායක විය යුතු අතර අධ්‍යාපනය ලැබීමට අවශ්‍යතාවක්, උනන්දුවක් මෙන් ම ධාරණය කර ගැනීමට උත්සහයක් දැරිය යුතු වන්නේ යම් සේ ද කිතු සමිඳුන් දුන් විමුක්තිය භුක්ති විඳිනු වස් ඒ සඳහා අපට පිපාසයක් තිබිය යුතු අතර අප සැමගේ සහයෝගය, උනන්දුව එනම් සක්‍රීය දායකත්වයක් අත්‍යවශ්‍ය වේ. මේ නිසා දේව වචනය අසන්නන් නොව, දේව වචනය අසා සැබැවින් ම එය පිළිපදින්නෝ, විමුක්තිය උදා කරගනු ලබන්නෝ ය. මන්ද මතෙව් සුවිශේෂය දක්වන පරිදි "යමෙක් මාගේ වචන අසා ඒවා පිළිපදී ද ඔහු පර්වතය මත තමාගේ ගෙය තනාගත් නැණවතෙකුට සමාන ය. වැසි වැස, ජලය ගලා, සුළං හමා ඒ ගෙට ගැසී ය. එය පර්වතය මත පිහිටි බැවින් බිඳ නොවැටිණි" (මතෙව් 7:24-25) යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කර ඇති බැවිනි.

විමුක්තිය යනු ජේසුස් වහන්සේගෙන් අප ලද උතුම් ම ත්‍යාගයක් වන අතර එම ත්‍යාගය ලබා ගැනීමේ මාර්ගය හෙවත් උන්වහන්සේ අපගේ

පාප ප්‍රශ්නයට ලබා දුන් විසඳුම වන්නේ සමගි සන්ධානය නැමැති දේව ප්‍රසාද නිධානය යි. මන්ද "මනස්ස්ථාපනය වීමට වුවමනාව නැතැ යි සිතන සිල්වතුන් අනූ නව දෙනෙකුට වඩා මනස්ස්ථාපනය වන එක පව්කාරයකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය ඇති වන්නේ ය" (ලූක් 15:7) යනුවෙන් ලූක් සුබාරංචිය දක්වන බැවිනි. ඒ අනුව විමුක්තිය ලබා ගැනීම යනු අප තවදුරටත් සදාකාලික සාපයට නියම වූ පව්කාරයකු නො වන බව වන අතර අපගේ පව් ගැන සැබැවින් ම පසුතැවිලි වී සැබෑ සිත් හැරීමක් තුළ දෙවිඳුන් වෙත හැරෙන්නේ නම් අප සැමට ස්වර්ග රාජ්‍යයේ දොරටු විවෘත වී විමුක්තිය ලබා ගැනීමේ හැකියාව ලැබෙනු ඇත. මෙය තවදුරටත් සනාථ කරනු වස් නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව ගෙන හැර දැක්විය හැකි ය. එහි දී නැති වූ පුත්‍රයා නැවත තම පියා වෙත පැමිණි පසු "පියාණෙනි, දෙවියන් වහන්සේට විරුද්ධව ද ඔබට විරුද්ධව ද මම පව් කළෙමි. මින් මතු ඔබගේ පුත්‍රයා යැයි කියනු ලබන්නට නො වටිමි" (ලූක් 15:21) යි කී ය. මෙලෙස ඔහු තම පව්වලට සැබෑ ලෙස ම පසුතැවිලි වූ ආකාරය හඳුනා ගත හැකි අතර ඔහුගේ පියා ඔහු එලෙස සිත් හැරී නැවත තමා වෙත පැමිණීමේ ප්‍රීතිය වෙනුවෙන් සාදයක් පැවැත්වී ය. මෙමඟින් දෙවියන් වහන්සේගේ මාතෘක ලක්ෂණ අපිට හඳුනා ගත හැකි අතර උන්වහන්සේ අපට දක්වන අසීමිත ආදරය හේතුවෙන් සැබෑ ලෙස ම මනස්ස්ථාපනය වන්නාට විමුක්තිය ලබාදී සදාතනික ජීවනය උරුම කර දෙන බව පැහැදිලි වේ.

මෙලෙස ආදි මවුපියන්ගේ අකීකරුකම හේතුවෙන් ලෝකය යක්ෂයාට වහල් වී මරණය හිමි වූ අතර ජේසු සමිඳුන්ගේ කීකරුකම කරණකොට ගෙන ලොව යක්ෂයා කෙරෙහි වූ වහල් බවින් මිදී සදාතනික ජීවනයට දොරටු විවර වී විමුක්තිය ලැබුණු සේක. ප්‍රසාද ස්නාපනය තුළින් ක්‍රිස්තු අනුගාමිකයන් වන අප සැම කිතු සමිඳාණෝ සිය මරණය හා උත්ථානය තුළින් ලබා දුන් විමුක්තියට හවුල්කරුවන් වන අතර එම විමුක්තිය අත්පත් කර ගනු වස් දේව වචනය අනුව දිවි ගෙවමින් අප පව්වලට සැබෑ ලෙස පසුතැවිලි වී සිත් හැරීමකට යොමු වෙමු.

**ශෙලින්ඩා සමරසිංහ,**
නීති පීඨය, අවසන් වසර,
කොළඹ විශ්වවිද්‍යාලය.

# විමුක්තිය ලැබගන්නට

අසාධාරණය දැකගෙන ඔබ නිහඬව නොසිටියේ
අසරණ අප වෙනුවෙන් බව නැත තිබුණේ මතකයේ
හඬ නංවන විට බලයෙන් මත් වූවන් ඉදිරියේ
දෙව් පුතුනි ඔබට නියම විය මරණය කුරුසියේ

වලංගු නොවුණි ඔවුනට ඔවුන්ගේ ම නියමය
එකක් කියා එකක් කළේ එදවසේ දි උන්මය
දරාගන්න නොහැකි වුණේ මතුකොට පෙන්වීමය
වරද එය යි කුරුසේ මරණය වන්නට උරුමය

කරන විට දි අකට අයුතුකම් අබියස අරගල
ඇදුණ නමුදු ඔබ පසුපස නිරතුරු ගැසෙමින් පෙළ
සත්‍යය කණපිට හරවන විට තණ්හාවෙන් බල
පෙන්වාදීමයි වරද දෙව්පුතුනී ඔබ කළ

කියන්නට කිසිවකු නොවුණි අසරණ අප හට
සහන සැදූ හැටි මතකය ගැතිකම් දැක්වූ විට
කුරුසේ මරනු යැයි කියා හඬ නංවන තරමට
ජුදයින් පසුපස ඇදුණෙමු අපි ඔබ අමතක කොට

සොරෙකු ලෙසින් අල්ලාගෙන ගොසින් මාළිගය වෙත
කටු ඔටුන්න තැබුවා අවමන් කරමින් හිස මත
දුන්නේ දඬුවම නිරිඳුන් සෝදා ගනිමිනි අත
ඇත්ත යුත්ත හෙළි කළ වරදට නිදහස හිමි නැත

නායක පූජකයින්ගේ සියලු චෝදනා බොරු
තනිවූ ඔබ හට කරන්න හැකිවූයේ නැත දුරු
ලැබ දුනි කසපහර ඔබට මුළු රැය එළිවෙන තුරු
කුරුසේ මරණය වලඳින විටදී සැඟවුණි හිරු

දේව මාළිගය වනසා දැමුවත් ලෙසටම දෙසූ
නැවතත් ගොඩ නැඟුණි එය තුන් දින ගත වුණු පසු
දොරටු ඇරුණි අගුලු මිදුණි නොසැලෙන විලසින් වැසූ
සිනාසුණි වෙරෝනිකා ඔබගේ කඳුළැලි පිසූ

විමුක්තිය ලැබ දෙන්නට ජනතාවට අසරණ
ඔබ මෙන් සමිඳුනි ගන්නට සැම දෙනටම පෙරමුණ
පෙරට ඇදෙන්නට මතු වන බාධක සැම ජය ගෙන
දෙව්පුතුනි ශක්තිය ඔබගේ හිමිකර දෙනු මැන

**පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව**

# ලිවීම හා කියවීම, දිවැසිවර හා එඬේරික කාර්යයන්

**කියවිල්ල හා කියවීම**

'තොර තෝංචියක් නැතිව කියවනවා' 'ඕන වෙලාවක කියවිල්ල' වගේ ව්‍යවහාරයන් විසින් මතු කරන කියවිල්ල යනු කයිය ගැසීම යි. 'එයාට හොඳ කියවීමක් තියෙනවා' කියන ව්‍යවහාරයෙන් මතු කරන 'කියවීම' යනු පොත්පත් කියවා, ජීවිතය හා ලෝකය කියවා ලබා ගෙන ඇති බහුශ්‍රැතභාවය යි.

පොත්පත් මතුපිටින් නො කියවා පේළි අතර ද, පේළිවලින් ඔබ්බේ ද, සංසන්දනාත්මකව ද, විචාරාත්මකව ද 'කියවීම' සැබෑ කියවීම වේ. එවැනි කියවීමක් මසැස සමග නොව මනැස සමග සම්බන්ධ වේ. තෙවනැස සමග සම්බන්ධ වේ. ක්‍රිස්තියානි භාෂාවෙන් කියන්නේ නම් පණැස සමග සම්බන්ධ වේ. ප්‍රාණයාණන් සමග සම්බන්ධ වේ. මේ බව අපට පසක් කරන්නේ දෘශ්‍ය ඌණතා ඇත්තෝය. ඔව්හු බ්‍රේල් ක්‍රමයට ලියවුණු පොත් කියවන්නේ මසැසින් නොවේ. ඔව්හු කියවන්නේ දෘශ්‍යමාන අකුරු නොවේ. දැන් හඬ පොත් ද තිබේ. දෑස ම නොපෙනෙන ඉතා හොඳ කියවන්නෝ සිටිති.

**කියවීමේ උත්තමාදර්ශය වන ජේසුස් වහන්සේ**

ප්‍රාණයාණන් කියවීම හෙවත් ශුද්ධාත්මයාණන් තුළ කියවීම හෙවත් පරිපූර්ණ කියවීම පිළිබඳ උත්තමාදර්ශය වන්නේ ජේසුස් වහන්සේ ය. උන්වහන්සෙගේ කියවීම මහා කියවීමකි. උන්වහන්සේ ව්‍යවස්ථාවලිය හා දිවැසියාවලිය අතැඹුලක් සේ කියවා තිබුණි. ගලීල දේශනයේ දී උන්වහන්සේ ග්‍රන්ථය දිග හැර මෙසේ ලියා ඇති තැන සොයාගත් සේකැ යි ලූක් තුමා සඳහන් කරයි. ජේසුස් වහන්සේ කියවීමේ උත්තමාදර්ශයකැ යි අප කියන්නේ උන්වහන්සේට ශුද්ධ ලියවිලි පාඨ කටපාඩම්ව තිබූ නිසාවත්, පාඨය ඇති තැන සැණකින් කීමටත් හැකි වූ නිසාවත් නොවේ. අද ජනප්‍රිය බයිබල් තරග හා පවතින අධ්‍යාපනය තුළ එවැන්නෝ ලක්ෂ ගණන් බිහි වෙති; සිටිති. අද අප අතර උන්වහන්සේටත් වඩා පුළුල් වූ බයිබල් පාඨ කට පාඩම් කරගත් උගත්තු කොතෙකුත් සිටිති. දේව ධර්ම ඩිප්ලෝමාධාරීන්, උපාධිධාරීන් සම්මත සිංග්‍රිසියෙන් කීවොත් මාස්ටර්ස් කළ අය, ඩොක්ටරේට් කළ අය, පී. එච්. ඩී. කළ අය ඕනෑ තරම් සිටිති. එහෙත් උන්වහන්සේට තිබුණු කියවීමෙන් අබමල් රේණුවක කියවීමක් ඉන් බහුතරයකට නැත. 'ඇතැමුන් ජේසු සමිඳාණෝ ඊශ්‍රායල්හී සමිඳාණෝ' යි සඳහන් පාඨ ගෙන ඊශ්‍රායලය පලස්තීනයේ සිදු කරන ජන සංහාරයේ දී අප ඊශ්‍රායලයේ පැත්තේ යැයි කියති; ලියති. එය කෙතරම් විකෘති කියවීමක් ද? පරිසිවරුන් ද, සදිසිවරුන් ද, ව්‍යවස්ථාවලිය හා දිවැසියාවලිය හොඳින් කියවා තිබුණි. කට පාඩම් කර තිබුණි. එහෙත් ඔවුන්ට එහි සාරය, හරය, හසුවී නො තිබුණි. ඔවුන්ගේ වැරදි කියවීම ගැන ජේසුස් වහන්සේ මෙසේ පවසති. 'විනයධරයෝ ද, පරිසිවරු ද මෝසෙස්ගේ ව්‍යවස්ථාවලිය පිළිබඳ අටුවාචාරිවරු වෙති. ඔව්හු එකක් කියති. අනිකක් කරති. ඔව්හු ශුද්ධ ලියවිලි සහිත බඳන පළල් කරගෙන නළලෙහි ද, බාහුවල ද පලඳිති.' ජේසුස් වහන්සේ කියුවේ ඔව්හු අන්ධ කියවන්නන් බව යි. විසකුරු කියවන්නන් බව යි. කෛරාටික කියවන්නන් බව යි. එවැනි කියවීමක් අපරාධකාරී කියවීමක් බව යි.

'අන්ධ මාර්ගෝපදේශකයනි, ඔබට වන විපතක මහත. කෛරාටිකයනි, ඔබට වන විපතක මහත... සර්පයෙනි, පොළොං වංශයෙනි, ඔබ නිරයේ දඬුවමින් ගැලවෙන්නේ කෙසේ ද ?'

**කියවීම බරපතළ කාර්යයක්**

කියවීම වගකීම් සහගත කාර්යයක්. බරපතළ කාර්යයක්. පුහුණු විය යුතු කාර්යයක්. අපි නිතරම ආත්ම සෝදිසියක යෙදෙන්න අවශ්‍ය යි.

අපි අන්ධ කියවන්නෝ ද? අපි කෛරාටික කියවන්නෝ ද? අපි විසකුරු කියවන්නෝ ද?

ප්‍රැන්සිස් බේකන්ගේ ජනප්‍රිය පාඨයක් අපි හැමෝම දන්නවා. 'කියවීම මිනිසා සම්පූර්ණ කරයි.' ඒ කියමනේ නව කොටස් දෙකක් තිබෙනවා. ඒ තමයි 'සංවාදය මිනිසා සූදානම් කරයි. ලිවීම මිනිසා පරිපූර්ණ කරයි.' කියන කොටස් දෙක. නිකම්ම කියවීමේ යෙදුණට මිනිසා සම්පූර්ණ වෙන්නේ නෑ. පරිපූර්ණ කියවීමක් තියෙන්න ඕනි. මොකක්ද පරිපූර්ණ කියවීමක් කියන්නේ? ජීවිතය සමග, කාලය සමග, ලෝකය සමග,

ආබද්ධ වූ කියවීමක් තමයි පරිපූර්ණ කියවීමක් කියන්නේ. කාලයේ ලකුණු කියවීම කියලයි ජේසු ඒ කියවීම අරුත් ගැන්වූයේ. කාලයේ ලකුණු කියවන්න බැරි කියවීම එලක් නෑ කියලා ජේසු අර අන්ධ කියවන්නන්ට මෙහෙම කියනවා.

'කෛරාටිකයෙනි, අහසේ ද, පොළොවේ ද ලකුණු තෝරා දීමට ඔබ දන්නාහු ය. එහෙත් තත්කාලීන ලකුණු විමසා දැනගන්න ඔබට පුළුවන'

ලංකාවේ කිතුනු යැයි කියා ගන්නා දේව ධර්මචාර්යවරු, ලේඛකයෝ, දේශකයෝ බහුතරය ශ්‍රී ලංකාවේ පැවැති යුද්ධය කියවූයේ වැරදියට ය. ආරම්භයේ දී මෙන් ම දැනුදු අප්‍රියෙල් 21 ප්‍රහාරය කියවන්නේ වැරදියට ය. එහි ප්‍රතිඵලය වූයේ ගෙවුණු දශක දෙක තුළ කිතුනුවෝ දුෂ්ට පාලකයින්ට ඔටුනු පැළඳවීම යි. ඉන්පසු අපි රැවටුණා යැයි නාහෙන් හැඬීම යි. ඉදිරියේ දී සිදුවන්නට යන්නේ ද ඊට වඩා වෙනස් දෙයක් නොවන බව පෙනෙන්නට තියෙන්නේ.

**ගෝලයින්ට පවා දුර්වල කියවීම් තිබුණා.**

ඇයි අපි වැරදියට කියවන්නේ? වැරදි කියවීමකට අපි යොමු වී තිබෙන්නේ ඇයි? අපි කියවන්නේ ලෝකය අපිට දුන්නු මතවාදයන් තුළ සිටිමින්. ශුද්ධාත්මයාණන් තුළ සිටිමින් නොවෙයි. ජේසුගේ ශ්‍රාවකයින්ටත් මේ ගැටලුව තිබුණා. ඔවුන් පවා ජේසුව කියවූයේ ලෝක දෘෂ්ටිය, වඩාත් නිශ්චිතව කියනවා නම් පාලකයින්ගේ දෘෂ්ටිය අනුව යි.

සෙබදි තම පුත්‍රයන් දෙදෙනාට ඇමති පදවි ඉල්ලන කොට ජේසු කියනවා 'ඔබ ඉල්ලන්නේ කුමක්දැයි ඔබ දන්නේ නෑ කියලා.' ශුද්ධාත්මයාණන් තුළ කියවීම කෙබඳු ද යන්න හඳුනා ගත හැකි කදිම නිදසුනක් තමයි පේදුරුට එක ම මොහොතක ජේසු දක්වන දෙයාකාර ප්‍රතිචාර. 'මම කව්ද කියා ඔබ සිතන්නේ ද?' පේදුරු කියනවා 'ඔබ ක්‍රිස්තුවරයා කියලා' එතකොට ජේසු කියනවා ඒක ඔබට ශුද්ධාත්මයාණන්ගෙන් ලැබුණු අනාවරණයක් කියලා. ඉන්පසු ජේසු පේදුරුගේ කියවීමේ ගැඹුර පරීක්ෂා කරනවා. ජේසු කියනවා 'මට දුක් විඳලා මැරෙන්න වෙනවා කියලා.' පේදුරු කියනවා එහෙම වෙන්න දෙන්න බෑ කියලා. ජේසු මොකක් ද ඊට දක්වන ප්‍රතිචාරය? 'සාතන් අහකට පල'. අශුද්ධාත්මය කියන්නේ මිනිසුන්ට වැහෙන යකෙක් නෙවෙයි. මිනිසුන්ගේ දේව දැක්ම වසා දමන ධනයේ බලයේ දෘෂ්ටිවාදයන් අධිපති මතවාදයන්.

**කොහොම ද පරිපූර්ණ කියවීමකට ඇතුළු වන්නේ?**

ඉතා කෙටියෙන් කීවොත් පරිපූර්ණ කියවීමක් අවශ්‍ය නම් 'යාච්ඤාවක් ලෙස කියවන්න' අප පතපොත ගැන දිගු කලක් ලියන විචාර සඳහා යොදෙන ශීර්ෂ පාඨය එය යි. 'යාච්ඤාවක් ලෙස කියවන්න.' යාච්ඤාවක් ලෙස කියවීම කියන්නේ යාච්ඤා පොතක තිබෙන යාච්ඤාවන් පොත බලාගෙන කියවා දමනවා වගේ කියවීම නෙවෙයි. කියවන දේ අතර දෙවියන්ට ඇහුම්කන් දෙමින් කියවීම. දෙවියන්ගෙන් ඇසෙන හඬ සටහන් කරගනිමින් කියවීම. ඒ හඬට අවදි වෙමින්, ඒ හඬට අවනත වෙමින්, ඊට ප්‍රතිචාර දක්වමින්, ඒ තුළ වෙනස් වෙමින්, ඒ තුළ ක්‍රියාකරමින් කියවීම. පරිපූර්ණ කියවීමක, යාච්ඤාමය කියවීමක ලක්ෂණය කුමක් ද? එය ක්‍රියාවේ කියවීමක්. දෙවියන් පවසන දේ ක්‍රියාවට නගන ක්‍රියාවක්. කියවීමේ ගැඹුරු තැන ක්‍රියාව යි.

**කියවීම අභියෝගාත්මක කාර්යයක්.**

ඉහත කරුණු මෙනෙහි කළා ම ඔබට පසක් විය යුතුයි කියවීම අභියෝගාත්මක කාර්යයක් කියන දේ. මොක ද වෙනස් වෙන්න වෙනවා. වෙනස් වෙන්න කැමැති හදවතක් නැති අයට පරිපූර්ණ කියවීමක් කරන්න බෑ. ඔවුන්ගේ කියවීම ව්‍යාජ කියවීමක්.

මේ දිනවල ලංකාවේ ක්‍රිස්තියානියේ ලොකු ම කතා බහ වන අප්‍රේල් 21 ප්‍රහාරයට ඇසුරින් මේ ක්‍රියාවේ කියවීම ගැන යමක් කිව්වොත්, මේ ප්‍රහාරයට පසුබිම් වූ මතවාදය, දේශපාලනය ගැන 2019 අප්‍රේල් 21 ට පෙර ලංකාවේ ක්‍රිස්තියානින්ගේ කියවීම කොයි වගේ ද? එය ජේසුගේ වචනවලින් කීවොත් සාතන් අහකට පල කියලා පවසන වර්ගයේ කියවීමක්. අපි අවංක වෙන්න කැමැති නම්, අපිට තිබුණේ, බහුතර ක්‍රිස්තියානින්ට තිබුණේ අප්‍රේල් 21 ප්‍රහාරයට පාර කැපූ ඉස්ලාම් ෆෝබියා දේශපාලනයට ම උඩ ගෙඩි දෙන ක්‍රියාවන්. මුස්ලිම් විරෝධී ජාතිවාදී ආගම්වාදී කියවීමක්. පරිපූර්ණ කියවීමකට ඇතුළු වන්න නම් අපි ජනප්‍රිය නොවන මාවත් තෝරාගන්න වෙනවා. අපිව 'පොර' කර ගන්න උන්නතිකාමී මාවත් වලින් ඉවත් වෙන්න වෙනවා.

15 වන පිටුවට .....

මහින්ද නාමල්

# විමුක්තියේ ස්වාධීනත්වය

ස්ත්‍රියක ගර්භාෂයේ කළලයක් පිළිසිඳ ඇති බව දැනගත් දා පටන් කලලය මෝරා දරුවා ප්‍රසූත කරන තුරු සියලු සංවේදීතාවන්ට ප්‍රතිචාර දක්වන්නේ මෝරා වැඩුණු කලලය ගර්භාෂ බිත්තියට දක්වන්නා වූ චලන තත්ත්වයන් මඟිනි. පුරාණ ග්‍රීක නාට්‍යයක වැඩිහිටි ස්ත්‍රියක් අවිවාහක තරුණියකගෙන් ප්‍රශ්නයක් අසයි.

"උඹට දැනගන්න ඕන ද දරුවෙක් බඩට ආවම කොයි වගේ ද කියල? එහෙනම් කුරුලු පැටියෙක් අල්ලගෙන ලිහිල්ව මිට මොළව ගනින්. ඌ දඟලනකොට කිති කැවෙන්නෙත් එහෙම තමා"

දරුවකු මව් කුසින් බිහිව පෙකිණිවැලට සම්බන්ධ වී පවතින තුරු ඒ බිලිඳා නිදහස් නොවේ. මාස හත අටක් රහසේ වැඩුණ කලලය රැක බලා ගත් ප්‍රීතියට වඩා දෝර ගලන සතුටක් තම දෑතේ උණුසුම් වන දරුවා දැකීමෙන් මව අසීමිත ප්‍රීතියක් ලබයි. එමෙන්ම මෙලොව එළිය දැකීමෙන් සෙනෙහස ආදරය නව ලොවක වින්දනීය බව අත්දකින දරුවා නිදහසේ සිහින කෙමෙන් සැබෑ කර ගනියි. එය මව මෙන් ම දරුවා ද ලබන ස්වාධීනත්වයට වඩා ඔබ්බට ගිය විමුක්තියකි.

මෝසෙස්තුමා ඊශ්‍රායෙල් ජනතාව වහල් සේවයෙන් මුදා රතු මුහුදෙන් එතෙර කර ඒ ලබා ගත් උදාරතර නිදහස ගැන එතුමන්ගේ පැසසුම මෙසේ දැක්වේ.

"සමිඳුන් හට මම ගී ගයමි, එතුමාණෝ තෙද මහිමෙන් ජයගෙන අසුන් හා අසරුවන් මුහුද මැද හෙළූ සේක. සමිඳාණෝ, මා සවිය හා ගීතය වෙති; එතුමාණෝ මා විමුක්තිය වෙති; මාගේ දෙවිදාණෝ ය. මා දෙවිතුමන් මම පසසමි. මා පියාගේ දෙවිඳුන් මම වණමි" (නික්මයාම 15:1-2).

මෝසෙස්තුමන් දෙවිඳුන්ට මේ ප්‍රීති ගී ගායනා කරන්නේ සකල පීඩාවන් උවදුරු හා වේදනාවන් මැදින් ජයගත් ගමනක අවසානය භුක්ති විඳිනු පිණිස ය.

ශ්‍රී ලංකාවේ අප ද විවිධ රජයන් යටතේ රාජ්‍ය නායකයන් හා ඔවුන්ගේ හෙන්චයියලා යටතේ පීඩනයෙන් සිටි යුගයට ඒකීය ජනතාවක් ලෙස විරෝධය පළ කරමින් අතු ගා කුණු වළකට ඇද දැමුවේ අපට නොව අපේ අනාගත පරපුරට විමුක්තිය උදා කර දෙනු පිණිස ය. ඒ දේශපාලනික වශයෙන් අප සෙවූ අප පැතූ විමුක්තිය යි. නිදහස හෝ ස්වාධීනත්වය විමුක්තියට සමාන කළ හැකි වූව ද අර්ථාන්විත විමුක්තිය නම් දීර්ඝ කාලයක් බැඳී තිබූ යදමින් නිදහස් වීම ය. ආධ්‍යාත්මික වශයෙන් 'ක්ෂණික' විමුක්තිය සොයන්නන් අතර කිතුනුවෝ අංක එකට සිටිති. අන්තිම රාත්‍රී භෝජනයේ දී ක්‍රිස්තුන් වහන්සේ ශ්‍රාවකයන් අමතා ප්‍රකාශ කළ වචන මොහොතකට අප සිහිපත් කරමු. "මා සිහිකිරීම පිණිස මෙය සිදු කරන්න" යනුයි ඒ. එදා රාත්‍රියේ පටන් අද දක්වා ලොව නො කඩවා සිදු වන ප්‍රාතිහාර්යය නම් පූපය සහ මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරය බවට මාංසගත වීම යි.

එහෙත් අද තැනින් තැන මතුවන සුව මෙහෙය, යාච්ඤා මෙහෙය, ප්‍රශංසා මෙහෙය, නිරාහාරශීල මෙහෙය ආදියෙන් ඇතැම් කිතුනුවන් පතන්නේ 'ක්ෂණික නූඩ්ල්ස්' ඉක්මන් ප්‍රාතිහාර්යයන් ය. අත පය හිසේ කොන්දේ අමාරු ඉක්මනින් සුව වන ප්‍රාතිහාර්යයන් ය. සුව මෙහෙයන් සංවිධානය කරන ගිහි භවතුන් ඉදිරියේ පාප උච්චාරණය කර ලබා ගන්නා 'ක්ෂණික නිදහස් වීම ය.' එහෙත් සැබෑ විමුක්තිය එය නො වන බව ද මනා වැටහීමක් ඇත්තේ ද අපට ම ය.

"භක්ති ප්‍රබෝධනය සඟරාවට නිතර නිර්මාණ සපයන සපුගස්කන්දේ රංජිත් බාලසූරිය ලේඛකයා විසින් සිය 'අනාගාමික කිතුනු ප්‍රාර්ථනා' කෘතියට සැපයූ නිර්මාණයක කොටසක් එතුමාගෙන් ලත් අවසරයෙන් මෙසේ උපුටා දක්වමි."

චාරිත්‍රමය වත් පිළිවෙත් ඔබව ප්‍රබෝධවත් කරන්නේ ය. එකට රැස් වී ශබ්ද නඟා නොයෙක් ඉරියව් පාමින් යැදුම් හා පැසසුම් පිණිස නිර්ලෝභිව ඔබ කාලය පූජා කරන්නෙහි ය. මම එසේ නො කරමි. මා තුළ නිහඬව මෝර දෙන යාච්ඤා ප්‍රශංසා සහ ප්‍රාර්ථනා මටත් වඩා හොඳින් උන්වහන්සේට පෙනෙන නිසා ය. (පිටුව 118)

සැබැවින්ම විමුක්තිය යනු දේව දීමනාවකි. වරප්‍රසාදයකි. එය දිව්‍යමය තිළිණයක් සේ රැක ගැනීමට අප කොතරම් වෙහෙසෙමු ද? ඒ තරමට ම අප විමුක්තිදායකයෝ වෙමු ද?

මංගල ජයවර්ධන
ගිංතොට

# ජොන් ෆ්‍රැන්සිස් විලියම් අබේකෝන්

සැබෑ කිතුනු අනුගාමිකයකු, විද්වතකු, නිහඬ හා සරල දිවි පෙවෙතක් ගත කරමින් ආදර්ශය සැපයූ අබේකෝන් සූරින් නොබෝදා අපෙන් වෙන්ව ගියේ ශ්‍රේෂ්ඨත්වයට හිමිකම් ලබමින්. නිදහස් අධ්‍යාපනයේ අනුහස ලැබ පේරාදෙණිය විශ්වවිද්‍යාලීය වරම් ලැබුව ද, ප්‍රවේශය ලබා ගන්නට නොසිතූ ඔහු, වෘත්තියමය වශයෙන් ශ්‍රී ලංකා තැපැල් සේවයට බැඳී තැපැල් ස්ථානාධිපතිවරයකු ලෙස වව්නියාව, නුවරඑළිය සහ කොළඹට සේවාව දෙන ලදී. විශ්‍රාම යාමෙන් පසුව මහනුවර සාන්ත අන්තෝනි විදුහලේත්, කොටහේන සාන්ත බෙනඩික් විදුහලේත් ඉගැන්වීම් කටයුතු වල නිරත විය. 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පත මඟින් චිරාත් කාලයක සිට 'සුබස' තුළින් නිවැරදි සිංහල කියා දෙන්නට යොමු වූ මෙතුමා, පාලි, සංස්කෘත, ලතින්, ඉංග්‍රීසි හා මව්බස පිළිබඳ මනා දැනුමකින් පූර්ණත්වය ලබා සිටි පඬිරුවනකි. එතුමා 'භක්ති ප්‍රබෝධනය' සඟරාවේ සෝදුපත් බලන්නට දායක වෙමින් අමිල කාර්යභාරයක් ඉටුකරනු ලැබුවේ හෘදයාංගමව යි. ඒ වනාහි ප්‍රබෝධනය යුග මෙහෙවරෙහි රනින් ලියවෙනු නො අනුමාන යි. අපටත් නිවැරදි සිංහල හොඳින් දැන ගන්නට ඒ තුළින් ලද භාග්‍යය වෙනුවෙන් එතුමට අපි ණයගැති වෙමු. මෙවන් යුගයක ඔබතුමන්ගේ වියෝවෙන් ඇතිවන හිඩැස පිරවීම ලෙහෙසි පහසු කාර්යක් නොවන බව ශ්‍රී ලංකා කතෝලික සභාවට අවබෝධ වනු ඇත.



**'භක්ති ප්‍රබෝධනය' එකසිය විසිපස් වසක වර්ෂාභිමාන මහෝත්සවයේ දී එතුමා උපහාර ලද මොහොත**

පියාණනි, අපි ඔබතුමාට සදා මොක් සුව පතමු !

**සංස්කාරක පියතුමා, කාර්යය මණ්ඩලය, ලේඛක සහ පාඨක සැම**

සටහන - රූපස් ප්‍රැන්සිස්

# විමුක්ති මඟට

අඳුරේ දූතු විසින් දෙව් දන බැමි බිඳිණි
'තහනම් තුරෙහි' ඵල ආහාරෙට ගැනිණි
මුල් මාපියන් උයනින් පන්නා දැමිණි
එද දෙව් පියා ඔවුනට තිළිණයක් දිනි

'ඔබ මට එරෙහි විය අඳුරේ දූතු විසිනි
ඉන් ඔබ සමග මගෙ ඇති බැඳියා බිඳිණි
නො ලැබෙයි අහර ඔබ දෙදෙනට පෙර ලෙසිනි
උපයා ගත යුතුය ඔබ දෙදෙනා විසිනි

"දන්නා නිසා ඔබෙ සිත්වල දුබල කම
මුදවා ගනිමි ඇදහුම් ඇති දනන් සැම
මගෙ ම පුතු එවමි ගලවන්නට ලොවම
ඔහු මඟ යතොත් ගැලවෙනු නියත ය සැවොම"

මුල් පව් දොසින් බැඳි බැමියා මුදන අටී
දෙව් පුතු ලොවට වැඩි ආකාරයක සැටී
මැදි රෑ ඉපිද ගව ඔරුවක නිදන පැටී
සිහියට නඟමි - නෙතු අග තුටු කඳුළු කැටී

ලෝ බොහො දෙනා අද මහ තරගයක යෙදී
දිවියට තමන් නොදැනි ම කර ගනිති හදී
දැක මේ පවිටුකම් දැඩි - ආ සිතට වැදී
රිදී - හදවතින් මතුවෙයි මෙවන් පැදී

ලී. හියුබට්. ඇ. ප්‍රනාන්දු

# අපේ සංවාද සංස්කෘතිය

දේශනයකින් පසුව සංවාදයක් ද පැවත්වීම යහපත් සම්ප්‍රදායයකි. එහි අරමුණ වනුයේ දේශිත කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කරමින් කරුණු පැහැදිලි කර ගැනීම ය.

එවැනි අවස්ථාවක දී කතා කරන්නට ඉදිරිපත් වන ඇතැම් ප්‍රේක්ෂකයන්ට කිසිම ප්‍රශ්නයක්, අපැහැදිලි තැනක්, එකඟ නොවන තැනක් හෝ විකල්පයක් ද නැත. නොනවත්වා කතා කිරීමේ ඇබ්බැහියක් පමණක් ඇත.

1. ප්‍රේක්ෂකයන් සමග සිදු වන සංවාද සාර්ථක වීමට නම්, පළපුරුදු දක්ෂ මෙහෙයවන්නෙකුගේ සේවය අත්‍යවශ්‍ය ම වේ.

2. මෙහෙයවන්නා වශයෙන් පත් කර ගත යුත්තේ කිසියම් මතවාදයකට ගැති නොවූ, විවෘත මනසක් ඇත්තෙකි. ආවේගික නොවීමට සංයමය ඇත්තෙකි. සවන්දීමේ හැකියාව ඇත්තෙකි.

3. සංවාදය තුළ දී ප්‍රධාන ශ්‍රාවකයා ඔහු විය යුතු ය, ඔහු අපක්ෂපාතී විය යුතු ය. අන් සියල්ලන් මැනවින් ඔහුට කීකරු විය යුතු ය.

4. ප්‍රේක්ෂකයන් ප්‍රශ්න විමසිය යුත්තේ ඔහුගෙනි. එම ප්‍රශ්න සුදුස්සන් වෙත යොමු කළ යුත්තේ ඔහු විසිනි.

5. කතා කිරීමේ දී එක් අයෙකුට එක් වරකට ගත හැකි කාලයේ උපරිමය ඔහු සඳහන් කළ යුතු ය.

6. තමන් අදහස් කරන දේ නිවැරදිව වචනගත කර ගැනීම සඳහා ප්‍රේක්ෂකයාට ඔහු සහය විය යුතු ය. ප්‍රේක්ෂකයකු පවසන්නේ කුමක්දැයි සමාලෝචනය කිරීමට ඔහුට හැකියාව තිබිය යුතු ය.

7. කතා කරන්නට අන් අයට ඉඩ අහිමි වන අයුරින් නො නවත්වා දිගින් දිගට ම කතා කරන්නන්ව උපායශීලිව නැවැත්වීමට ඔහුට හැකියාව තිබිය යුතු ය.

"බොහොම ස්තුතියි මහත්මයා, ප්‍රශ්නය පැහැදිලි යි. මම එය අහවලාට යොමු කරනවා"

"ඔබ පවසන දේ අද මාතෘකාවට අදාළ නෑ නේද? වෙන ම දවසක අපි ඒ සංවාද වෙමු නේද ?"

"කාලය සීමිත බැවින්, කරුණාකර ඔබේ ප්‍රශ්නය, එකඟ නොවන බව හෝ විකල්පය කෙටියෙන් හෙළි කරන්න"

8. කතාවේ ආක්‍රමණශීලීත්ව හික්මවා ගැනීම මෙන් ම, අදහස් පළ කිරීමට කුළෑටි වූවන්ව කතා කරවීමත් ඔහුගේ වගකීමකි.

"සුනිල් මහත්තයාගේ අදහස මොකක් ද ඒ ගැන ?"

9. තැනට උචිත ලෙස එවැනි නිවේදන කරමින් කාලය කළමනාකරණය කර ගැනීම ඔහුගේ වගකීමකි. එමෙන් ම ඉතිරිව ඇති කාලය ගැන සිහිගැන්වීම් ද ඔහු කළ යුතු වේ.

"තව එක ප්‍රශ්නයක් විමසීම සඳහා පමණයි කාලය ඉතිරිව ඇත්තේ."

"ඔබ ප්‍රශ්න කීපයක් විමසුවා. අරයාට අවස්ථාව ලැබුණේ ම නෑ. එබැවින් අපි ඔහුට අවස්ථාව දෙමු නේද ?"

10. සමස්ත සංවාදය පිළිබඳ සමාලෝචනයක් කිරීම ඔහුගේ වැදගත් ම කාර්යභාරයකි.

විශිෂ්ට දේශකයන්ව තෝරා ගැනීමට වඩා දක්ෂ මෙහෙයවන්නකුව සොයා ගැනීම දුෂ්කර ය. මන්ද එවැන්නන් බහුල නැති නිසා ය.

දේශකයකුගේ කාර්යභාරයට වඩා මෙහෙයවන්නකුගේ වගකීම බරපතළ ය.

විමල් දිසානායක, පද්ම ද සිල්වා, නන්දසේන රත්නපාල, වීරසිංහ දේවගැතිතුමා ආදි දක්ෂ මෙහෙයවන්නන් අතීතයෙහි බොහෝ වූහ. ජන මාධ්‍ය ආයතනයකින් පවා අද එවැන්නන් දුලබ ය.

යමෙකු උගතෙකු, කවියෙකු, ලේඛකයෙකු හෝ දැහැමියෙකු වූ පමණින් ඔහු දක්ෂ මෙහෙයවන්නෙකු වන්නේ නැත.

යමෙකු දක්ෂ මෙහෙයවන්නකු නොවීම ඔහුගේ නොවටිනාකමක් නොවේ. වෙනත් ක්ෂේත්‍රයක ඔහු අති විශිෂ්ටයකු විය හැකි ය.

අපේ සංවාද සංස්කෘතිය නොදියුණු අවධිමත් මට්ටමක පැවතීමට හේතු 3ක් පෙනේ.

1. දක්ෂ මෙහෙයවන්නන් දුලබ වීම එක හේතුව කි. එවැන්නන් බිහි කර ගත යුතු ය. සංවාද

මෙහෙයවීමේ කාර්යභාරය හැදෑරිය යුතු ය. ප්‍රායෝගික පුහුණුව ලබමින් ප්‍රගුණ විය යුතු ය.

2. මෙහෙයවීම නැමැති කාර්යෙහි වැදගත්කම බොහෝ සංවිධායකයින්ගේ අවධානයට යොමු වී නැත.

3. බොහෝ සංවිධායකයින්ගේ යටි අරමුණ වී ඇත්තේ කිසියම් මතවාදයක් ව්‍යාප්ත කරවීම මිස, නිදහස් චින්තනය පිබිදීම හෝ සංවාද සංස්කෘතිය නැංවීම හෝ නොවේ.

සංවාද සංස්කෘතිය නැංවීමේ නිර්ව්‍යාජ අරමුණින් සංවිධාන බිහි කර ගත යුතු ය.

සංවාද සංස්කෘතිය පහත් මට්ටමක පවතින විට, අවිචාරමත් එහෙයින් ද ආවේගයන් සමාජයෙහි පහසුවෙන් ව්‍යාප්ත වේ. ජනතාව මුළා කිරීමේ හැකියාව චතුර කථිකයන්ට ලැබේ.

**සපුගස්කන්දේ රංජිත්**

**ලිවීම හා කියවීම, දිවැසිවර හා එඬේරික කාර්යයන්**
**11 වන පිටුවෙන්.....**

සුදුසුකම් සපුරාගන්න, සහතික එකතු කරගන්න කරන කියවීමෙන් එතෙර වෙන්න වෙනවා. කියවීමේ එකම අරමුණ ප්‍රේමයේ රාජ්‍යයක් උදෙසා කැපවීම බවට පත් කරගත්තු කියවීමකට ඇතුළුවන්න වෙනවා. දේව අනාවරණය ඉවර ද? අපි අපේ කියවීම විමසමු.

- දැන් අපි අපේ කියවීම ගැන ආත්ම සෝදිසියක යෙදෙමු. ඔබේ කියවීමේ දිග පළල ගැඹුර කෙබඳු ද?
- නව ගිවිසුමෙන් පසු දේව අනාවරණය ඉවර ද? නව ගිවිසුම ලියා අවසාන වී සහශ්‍රක දෙකක් පමණ ගත වෙන්න ළඟයි. නව ගිවිසුමෙන් පස්සේ දේව අනාවරණය අපිට කියවන්න ලැබෙන්නේ කොහෙන් ද?

අවම වශයෙන් කතෝලික සමාජ දර්ශනය ගැන, අපි කියවා තිබෙනවා ද ? එහි ඉතිහාසය අමතක කරලා වර්තමානයට ආවොත්, අවම වශයෙන් ෆ්‍රැන්සිස් පාප් තුමන්ගේ කාලයේ විශ්ව චක්‍රලේඛන, අපොස්තලික අනුශාසනා ගැන ඔබේ කියවීම කෙබඳු ද? ඔබ අතරින් කාට හරි පුළුවන් ද ඒ ගැන ඔබේ කියවීම බෙදාගන්න...

උන්වහන්සේ ප්‍රථම අපොස්තලික අනුශාසනාව ප්‍රකාශයට පත්වන්නේ උන් වහන්සෙගේ පාප් ධුරයේ ප්‍රථම වර්ෂයේදී ම යි. ඒක අපේ කාලයේ දේව අනාවරණයක්. ඒ තමයි සුපුවතේ ආනන්දය. (එවැන්ලිජි ගයිඩියුම්) සීයට සීයක් ම සුමට පරිවර්තනයක් නො වුණාට ගොන්සාල්වේස් සිංහල ආයතනය එහි හොඳ පරිවර්තනයක් අපිට ලබා දීලා තිබෙනවා. ඒක සම්පූර්ණයෙන් ම කියවූ අය අප අතර කීදෙනෙක් සිටිත් ද?

**ඉතිරි කොටස ලබන කලාපයට...**

# ප්‍රේමය යි - විමුක්තිය යි !

මතුව එන සඳ
හදේ සෝ දුක
කඳුළු බිඳු විලසින්
"ළතෙත් හදකට
කියයි හිමිකම්"
නොමැත - කිසි සැකයක්

මමත්වය අත් හැරිය හදෙකින්
දකින කල ලෝ දන සිත්
ප්‍රේමයේ හරි අරුත් තුළ
සැරි සැරිය හැක සෙනෙහෙ සිතින්

කිතුනු හදෙකට උරුම කම් ඇති
බව පසක් වන සේ
පතුරු වන්නට දයා මෙත් ගුණ
දිරි දරමි - හැකි සේ

අනුන් දුක දැක - උණුව යන හද
ප්‍රේමයේ නාමෙන්
ලබන සැනසුම - බෙදන කල වේ
සග සුවේ මිහිරක්

කිතු වදන් හා යාව සැම විට
විමුක්ති මග යන බව හැඟෙන විට
කුරුසියක් සේ නොගෙන කරදර
ලබන මුක්තිය - 'නිරාමිස සුව'

ප්‍රේමය යි - විමුක්තිය යි
නිවුන් සෝවුරන් සේ වෙයි
මුසුව - සමිඳු පෙම සදයි
ලොව්තුරා වූ සිත් සුවේ

**නීටා අයි. ප්‍රනාන්දු**

# විමුක්තිදායකයාණන් තුළ ස්වර්ගය කරා ගමනක්

අප අදහන මෙම කිතු දහම, අප තුළ පැවතෙන්නේ අප සියලු දෙනා තුළ ඇති විශ්වාසය මත ය. දේව ජනතාව ලෙස දෙවියන් වහන්සේ තෝරා ගත් ඊශ්‍රායෙල් ජනයා හට මිසරයේ වහල් භාවයෙන් දුක් පීඩා විඳිමින් ගත කළ ජීවිතය අතහැර නිදහස් ජීවිතයක් ගත කිරීමට දෙවියන් වහන්සේ ඔවුන්ට ලබා දුන් විමුක්තිය පිළිබඳව ශු. බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් නික්මයාම පොත කියවා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

වර්තමානයේ ජීවත් වන ජනයින් වගේ ම එකල සමාජය තුළත් අයහපත් මාර්ගයේ ගමන් කරමින් පව්කාර ජීවිත ගත කරන බොහෝ දෙනා ජීවත් වූහ. එම පව්කාර ජනයා උදෙසා දෙවියන් වහන්සේ ආදි මව්පියන් සමග ඇති කරගත් ගිවිසුමට අනුව ගැලවුම්කරුවෙකු එවන බවට දුන් පොරොන්දුව තුළ අපට දානය කළ විශිෂ්ට ආදර්ශය වූයේ ක්‍රිස්තුන් වහන්සේ හෙවත් මනුෂ්‍ය ස්වභාවය ඇතිව මෙලොවට පැමිණි ශු. ත්‍රිත්වයේ දෙවන තෙම වූ පුත්‍ර වන දෙවියන් වහන්සේ ය.

මරිය තුමියගේ බැහැපත්කම, ජුසේ තුමාගේ ආරක්ෂාව හා ජේසුස් වහන්සේගේ කීකරුකම එදා මිනිසුන්ට මෙන්ම අපට ද විමුක්තිය ලැබීමට හේතු වූ කරුණකි. එය කිතුනු අපට ලැබුණු දේව ආශීර්වාදයකි. ශු. ලූක් ශුභාරංචියට අනුව ක්‍රිස්තුන් වහන්සේ අපගේ විමුක්තිදායකයාණන් හෙවත් ගැලවුම්දායකයාණෝ ය (ලූක් 2:11).

එකල සමාජය තුළ අදමිටුවන් බොහෝ සිටි බැවින් ක්‍රිස්තුන් වහන්සේ හට ඔවුන්ව දමිටු මිනිසුන් බවට පත් කිරීමට බව්තීස්මය ලබා ආරම්භ කළ දූත කාර්යයේදී හැකි විය. ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්යය, ඉගැන්වීම් හා අන් අයට ලබා දුන් අවවාද කෙරෙහි පැහැදුණු ජනයා උන්වහන්සේව ඇදහීමට, අනුගමනය කිරීමට හා විශ්වාස කිරීමට පටන් ගත්හ. උන්වහන්සේ නිසා ධර්මිෂ්ඨ කමට පත් වූ අය බොහෝ ය. (උදා -: මග්දලායේ මරියා හා සාකේවුස්) මෙලෙස ජේසුස් වහන්සේ ඔවුන් හට ආරාධනා කළේ මනස්ස්ථාපනය වී සිත් හරවා ගෙන යහපත් ජීවිත පරිණාමයක් තුළින් දේව රාජ්‍යයේ උදාව අත්දැකීමට ය.

දේව රාජ්‍යය, ස්වර්ග රාජ්‍යය නොවේ.

දේව රාජ්‍යය යනු,

උස් පහත් බේදයක් නොමැතිව, සියලු දෙනාට සාධාරණව හා එක සමානව සැලකීම, සාමය, සතුට, සමගිය, දෙවියන්ට මෙන් එකිනෙකාට ප්‍රේම කිරීම නම් දේව රාජ්‍යය වේ.

ස්වර්ග රාජ්‍යය යනු,

මෙලොව සිටියදී ම සූදානම් වෙමින් මරණයෙන් පසු ආත්මය දිනා ගන්නා තත්ත්වයකි. මෙය උරුම කරගන්නේ ධර්මිෂ්ඨයෝ (දෙවියන් වහන්සේ තුළ යැපෙන්නෝ) ය.

වර්තමාන සමාජය තුළ මිනී මැරීම්, මංකොල්ලකෑම්, දූෂණ, හිංසන හා මත් උවදුරු වැනි පාපී ක්‍රියා වර්ධනය වී තිබෙන අයුරු අපට දැක ගත හැකි ය. ඊට අමතරව සාරධර්ම පරිහානියට පත් වීමෙන්, අන් අයට ගරු නො කිරීම, වැඩිහිටියන්ට ගරු නො කිරීමෙන් මහලු නිවාස ද, ළමා නිවාස ද වැඩි වශයෙන් අද දැක ගත හැකිය.

දෙව්පියා මෝසෙස් හට දුන් දස පනත ද, අප උදෙසා ශු. සභාව විසින් දී තිබෙන ශික්ෂාපද ද ආරක්ෂා කරගනිමින් ද, සාන්තුවර, සාන්තුවරියන්ගේ ජීවිත ආදර්ශය ද ලබා ගනිමින් ද, දේවස්ථානයේ පියතුමන්ලා ලබා දෙන ඔවදන් ද පිළිපදිමින් යහපත් ජනතාවන් බවට පත් වීමට කිතුනු අපට හැකියාව තිබේ.

19 වන පිටුවට .....

**සඳුනි වාසනා පීන්තු,**
**11 ශ්‍රේණිය,**
**ශු. ප. බා. මහා විදුහල,**
**වෙන්නප්පුව.**

# තැනූ මන්දිර බිඳී වැටුණත් ( කෙටි කතාව )

බිත්තිය මත දිව යන හූනෙකු අල්ලා ගැනීමට උත්සාහ දැරූ කිටියා එම ක්‍රියාව ව්‍යර්ථ වූ විට නැවතත් සුපුරුදු ලෙසින් තම ශරීරය පිරිසිදු කර ගැනීමේ කාර්යයේ නිරත වන්නට විය. අහිමි වීම් ගැන සිතමින් ඌ ළතවන්නේ නැත. ඒලෙසින් තමාට ද සනුරි හා බැඳුණු අතීතය අමතක කර ජීවිතය නව කෝණයකින් ස්පර්ශ කිරීමට නොහැකි ද? ගෙවුණු දින කිහිපය තුළ හරිහැටි කෑමක් බීමක්වත් නොගෙන කල්පනා කරමින් පසුවූවා මිස රැකියාව සඳහා යාමටවත් උත්සුක නොවූ බව මේ මොහොතේ දිනුජ සිහිපත් කළේ සොවින් යුතුව ය. නළල දැඩිව පිරිමැද ගත් ඔහු අචේතනිකව මෙන් මුළුතැන්ගෙය දෙසට පියවර මැන්නේ ය.

"පුතා ඇහැරුණා ද....? ඉන්න මම තේ හදන්නම්....."

කොස් මදුලු ගලවමින් සිටි මව යුහුසුලුව නැගී සිටිමින් කේතලය ලිප තැබී ය. වැලිතලප තසිමක් මේසය මත විය. පෙර දිනක දී නම් ඔහු වැලිතලප කැබලි කිහිපයකට ම වග කියනු ඇත. එහෙත් අද ඔහුට ආහාර පිළිබඳ රුචිකත්වයක් නැත. දිනුජගේ රුචි අරුචිකම මත ආහාර සැකසීමට පුරුදු පුහුණු වී සිටි මව ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක් වන සහකාරිය තෝරා ගැනීමේ දී ඔහුගේ සිතැඟි වටහා ගැනීමට නො හැකි වීම අභාග්‍යයක් නො වන්නේ දැයි දිනුජට සිතිණි. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කළ දිනුජගේ පියා හදිසි අනතුරකින් දිවි ගමනට සමු දෙන විට ඔහුගේ වයස අවුරුදු අටකි. ගුරුවරියක වූ මවට තම එක ම දරුවා හදා වඩා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දරන්නට සිදු විය. දිනුජ පහ වසර ශිෂ්‍යත්වය සමත් වූ දින බොහෝ සොම්නසට පත් වූ මව ඔහුව කොළොම්තොට ජනප්‍රිය පාසලකට ඇතුළත් කිරීමට කටයුතු කළා ය. ගමේ පාසල හැර දමා යාමට නො හැකි බව පවසමින් ඔහු මවට කොතෙක් ඇවිටිලි කළත් අවසානයේ දී මවගේ තීරණය ස්ථිර විය. දිනුජගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වූයේ එම සිදුවීම යි. එතැන් සිට මවට අවැසි වූයේ ඔහුව නාගරික සංස්කෘතියට හුරු කර ඉහළ සමාජයට ගෙන යාම ය. අවසානයේ දී මවගේ සිහිනය සැබෑ කරමින් ඔහු ඉංජිනේරු වෘත්තියට ප්‍රවිෂ්ට විය.

නිවාඩුවක් ලද විගසින් මවගේ සුවදුක් බැලීමට පැමිණීම දිනුජ අතපසු කළේ නැත. දිනක් ඔහු එසේ පැමිණෙන විට සුපුරුදු රුවක් ඔහු ඉදිරියේ දිස් විය.

"කොහොම ද කාව්‍යා තොරතුරු....? ඔයා දැන් මොනවා ද කරන්නෙ......?"

"මම ගමේ පාසලට ම ගුරු පත්වීම හදා ගත්තා. දිනුජට නම් ඉතින් ගම හුරු නැහැනෙ නේද......?"

"එහෙම නැහැ...... නගරයේ ජීවත් වුණාට මම තාමත් ගමට ආදරෙයි......."

ඔහුට ගමේ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උලෙළ මතක් විය. ධාවන ඉසව්වකට සහභාගි වූ තමා වෙනුවෙන් ඔල්වරසන් දීම පිළිබඳව ඇයගේ නිවාසයේ මිතුරු මිතුරියන් ඇය හා උරණ විය.

"ඒක නෙවෙයි කාව්‍යා..... ඇයි ඔයා ඉස්සර Sports meet එකේදි මම ධාවන තරගවලට සහභාගි වෙද්දි මගේ නම කියලා කෑ ගහන්නෙ......."

"ඔයාට ඒකත් මතක ද......? මම හිතුවේ ඔයාට ඒවා අමතක වෙලා ඇති කියලා."

"කෝ ඉතින් පිළිතුර ලැබුණෙ නැහැනෙ......."

"ඒ ඔයා මගේ හොඳ ම යහළුවා නිසා......"

"තාමත් මම ඔයාගෙ හොඳ ම යහළුවා ද......?" දිනුජ ඇයගේ දෑස් දෙස ඍජුව බලමින් සිහින් සරින් ඇසුවේ ය...

"මම දන්නෙ නැහැ...." ඔහුගේ දෑස් මඟ හරිමින් කලබල ස්වරූපයෙන් කාව්‍යා පැවසුවා ය.

"මම ඔයා ගැන අදහසක් තියා ගත්තාට කමක් නැද්ද කාව්‍යා......?"

"ඔයාගෙ අම්මා ඔයා ගැන අහස උසට බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ. ළඟදි දවසක් මට මුණ ගැහුණු වෙලාවෙ කිව්වා ඔයාට කොළඹ පැත්තෙන් හොඳ මනාලියක් හොයන්න ඕනෙ කියලා - ඒ නිසා අපි ඕවා ගැන කථා නො කර

ඉමු." තෙත් වුණ දෑසින් යුතුව කාව්‍යා තෙපලුවා ය.

දිනුජට සරසවි බිමේදී විවිධ තරාතිරම්වල මිතුරු මිතුරියන් ඇසුරු කිරීමට අවකාශ ලැබිණි. එහෙත් සෙනෙහස පිළිබඳ අංශු මාත්‍රයක හැඟීමක් එම කිසිම තරුණියක කෙරෙහි හට නො ගත් බව ඔහුට සහතික ලෙසින් ම පැවසිය හැකි ය. කාව්‍යා මුණ ගැසුණු නිමේෂයේ දී සිත තුළ තරු කැට දහසක් දිලිහෙන සේ හැඟී ගිය බව නම් සැබෑ ය. ප්‍රේමය යනු එය නොවේ ද?

මව විසින් ගෙන එන මංගල යෝජනාවල නිමක් නැත. පුවත්පත් කිහිපයක් සෑම සති අන්තයේ ම රැගෙන එන ඇය සුදුසු යෝජනා සොයමින් වෙහෙසන අයුරු සුලබ දසුනකි.

"පුතේ ඔයාට හොඳ යෝජනාවක් තියනවා. වැදගත් පවුලක දැරිවියක්. උගත්කම, වත්පොහොසත්කම අතින් අඩුවක් නැහැ" දිනක් මව දිනුජ හා පැවසුවේ සොම්නසින් යුතුව ය. කාව්‍යා පිළිබඳව මව හා කථා කළ යුතු බව දිනුජට හැඟී ගියේ ය.

රාත්‍රී ආහාරයෙන් අනතුරුව දිනුජ මවට කථා කරමින්,

"අම්මෙ මට වැදගත් කාරණයක් ගැන කථා කරන්න තියෙනවා..." යැයි පවසමින් පිළිසඳර ඇරඹී ය.

"මොකක් ද කියමුකො බලන්න..." කාරණය කුමක්දැයි අවබෝධ කර ගත් මව දැඩි හඬින් ඇසුවා ය.

"මම කැමතියි කාව්‍යාව විවාහ කර ගන්න."

"පුතේ මේ මම දුක් මහන්සි වෙලා උගන්වලා හොඳ තැනකට ඔයාව ගෙනාවෙ මෙහෙම සිද්ධ වෙනවා බලන්න නෙවෙයි. ආයෙත් මාත් එක්ක ඔය සම්බන්ධව කථා කරන්න උත්සාහ කරන්න එපා. මගේ වචන දෙකක් නැහැ. ඔයා කැමති වෙන්න ඕනෙ මම ගෙනාව යෝජනාවට.."

මවට සිටින එකම දරුවා මා පමණි. පියා නොමැතිව මව මා හදා වඩා උගන්වන්නට ගත් වෙහෙස සුළුපටු නොවේ. ඇයගේ වැටුප මුළුමනින් ම වියදම් කළේ මා හට නොවේ ද.......? ඇය වන්දනා ගමනක් හෝ නො ගියේ මාගේ වැඩ කටයුතු අතපසු වන නිසා ය.

කාව්‍යාත්, මවත් අතරමැද තමා සිර වී සිටින්නාක් මෙන් දිනුජට දැනිණ.

බොහෝ සේ කල්පනා කිරීමෙන් අනතුරුව ඔහු මවගේ සතුට වෙනුවෙන් තමන්ගේ සතුට කැප කිරීමට තීරණය කළේ ය. කාව්‍යා වැනි නම්‍යශීලී, යථාර්ථයට මුහුණ දීමට හැකි යුවතියක් මවගේ යෝජනාවලින් හමු වනු හැකි ද.......? මව කවදා තමාගේ සිත තේරුම් ගනීවි ද........? දිගු හුස්මක් ගත් දිනුජ සියලු බලාපොරොත්තු අත්හැර දමන ලද්දකු මෙන් බලා සිටින්නට විය.

වේලිච්ච ඉරටු නමන්න බැහැ. නමන්න උත්සාහ කළොත් කැඩෙනවා. කවුරුන් හෝ කියූ මෙවදන් ඔහුට සිහිපත් විය.

"මට සමාවෙන්න කාව්‍යා......"

"සමාව ඉල්ලන්න ඔයා වරදක් කළේ නැහැනෙ දිනුජ. තිසි වයසෙදි ආදරය කිරීම වරදක් නෙවෙයි. මට ඔයාව තේරුම් ගන්න පුළුවන්. හැම හමුවීමක් ම එක්වීමකින් නිමා වෙන්නෙ නැහැ. අපි යථාර්ථයට මුහුණ දෙමු. හැමදා ම සතුටින් ඉන්න."

තමාට එසේ කියූ කාව්‍යා නික්ම ගියේ ද සතුටින් නො වන බව ඔහු දනී.

සනුරිගේ මව්පියන්ට විදෙස් ගතව සිටින වැඩිමහල් දියණිය වෙත යාමට තිබූ හදිසි අවශ්‍යතාව හේතුවෙන් දිනුජගේත්, සනුරිගේත් විවාහය කඩිනමින් සිදු විය.

"දිනුජ මම ඔයාට කැමති වුණේ ඔයා යුනිවර්සිටි ගිය බෝයි කෙනෙක් නිසා. ඔයාගෙයි ඔයාගෙ අම්මාගෙයි ගමේ තාලෙ මට ගැළපෙන්නෙ නැහැ." විවාහ වී තෙමසක් පමණ ගත වන විට සනුරිගේ මෙවැනි වදන් නිසා දිනුජ බොහෝ කළකිරීමට පත් විය.

"සනුරි ඔයා දැනගෙන හිටියානෙ මම ගමක ඉපදුණු කෙනෙක් කියලා. ඇයි දැන් මෙහෙම කථා කරන්නෙ....?"

"ඔයාට හොඳ ජොබ් එකක් තියෙනවා දිනුජ. ඔයා ජීවත් වෙන්නෙ හොඳ සොසයිටි එකක. ඉතින් ඔයාට පුළුවන් වෙන්න ඕනෙ ගම අමතක කරලා ජීවත් වෙන්න..."

ගම අමතක කළ හැකි වුව ද මව අමතක

කළ නො හැකි බව සනුරිට නො වැටහෙන්නේ මන් ද....? මව තවමත් ගමේ ගෙදර වාසය කරයි. සනුරිගේ අකමැත්ත නිසා දිනුජ මව තම නිවසට කැඳවාගෙන ඒමේ අදහස ද අත්හැර දැමුවේ ය. කෙසේ හෝ විවාහ දිවිය රැක ගත යුතු නොවේ ද......?

එහෙත් එක් සැඳෑවක සනුරි තම අදහස කිසිම පැකිළීමකින් තොරව කියා දැමුවා ය.

"දිනුජ මට ඔයාගෙන් ඩිවෝස් එක ඕනෙ......"

විවාහ වී වසරක් ගෙවී අවසාන ය. තමා විවාහ දිවිය ගත කළේ අපමණ වෙහෙසකින් බව සැබෑ ය. එහෙත් වෙන්වීමක් ගැන ඔහු කිසිසේත් ම සිතුවේ නැත. කැමති දේවල් නො ලැබෙන විට ලැබෙන දෙයට කැමති වීමට පුරුදු විය යුතු බව ඔහු උගත්තේ කාව්‍යාගෙනි. සනුරිගේ වදන් ඔහුට දැනුනේ හිස මත අකුණක් පිපිරුවාක් මෙන් ය.

"කෝ........ පුතා තවම වැලිතලප කෑල්ලක්වත් කාලා නැහැනෙ."

අතීත සිදුවීම් ආවර්ජනය කරමින් සිටි දිනුජ මවගේ හඬින් වර්තමානයට පිවිස මවගේ සිත සතුටු කිරීමේ අරමුණින් වැලිතලප කැබැල්ලක් අතට ගත්තේ ය.

"මට සමාවෙන්න පුතේ...... සක්කරවට්ටමක් ජෝඩු කරලා මම පුතාගෙ ජීවිතේ අවුල් කළා."

"සනුරිට වරදක් කියන්න බැහැ අම්මේ. එයා හැදුණු වැඩුණු පරිසරයට අම්ම යි, මම යි ගැළපුණේ නැහැ."

"මම කාව්‍යාව මුණ ගැහිලා කථා කරන්න හිතුවා......... අම්මාට පුළුවන් වෙයි ද දැන්වත් කාව්‍යාට යි, මට යි ආශිර්වාද කරන්න?"

මවගේ මුහුණ අඳුරු වලාවකින් වැසී ගියාක් මෙන් අවපැහැ විය.

"අනේ පුතේ ඒ දැරිවි ගමේ හිටියා නම් පුතාට කලින් මමයි යන්නෙ ඒ දැරිවි මුණ ගැහිලා කථා කරන්න....." මව විඩාබර හඬින් පැවසී ය.

"කාව්‍යා දැන් ගමේ නැද්ද......?"

"ගමේ තියා රටෙත් නැහැ."

කාව්‍යා උගන්වන පාසැලේ පැවති වෛද්‍ය සායනයකට පැමිණි තරුණ , කඩවසම් වෛද්‍යවරයෙකු කාව්‍යා ගැන පැහැදී නිවසට ම පැමිණ යෝජනාව ඉදිරිපත් කර ඇති බවත්, විවාහ වී ඔවුන් දෙපල එංගලන්තයේ පදිංචියට ගිය බවත් මවගෙන් සැල විය.

උගත් මෙන් ම ගුණ යහපත් සහකරුවකු කාව්‍යාට ලැබී ඇත. මසකට පමණ ඉහත දී ඇයගේ මව ද ඔවුන් වෙත ගෙන්වා ගැනීමෙන් එය ප්‍රත්‍යක්ෂ වේ.

පියාගේ අභාවයෙන් පසුව ද මවත් සමග තමා මෙම නිවසේ සතුටින් ජීවත් වුණා නොවේ ද.....? මවට සිටිනුයේ ද මා පමණ ය. ඉදින් අහිමි වී ගිය දෑ අමතක කර මවද රැක බලා ගනිමින් ජීවත් වීමට උත්සාහ දැරීම තමාගේ වගකීම නො වන්නේදැයි සිතමින් දිනුජ තේ කෝප්පය අතට ගත්තේ ය. නිවුණු තේ පානය කිරීමට දිනුජ අකමැති බව දන්නා මව ඔහුගේ අතින් තේ කෝප්පය රැගෙන සුළු මොහොතකින් උණුසුම් තේ කෝප්පයක් ඔහු අත තැබී ය. මවගේ ළෙංගතු දෑස ඔහුට ජීවත් වීමට මහගු සවියක් වන බව සහතික ය.

**තිරිස් දේවකා රත්නායක**
**පානදුර**

**විමුක්තිදායකයාණන් තුළ ස්වර්ගය කරා ගමනක්**
16 වන පිටුවෙන්.....

අතීතයේ ඊශ්‍රායෙල් ජනයා මිසරයේ සිට පොරොන්දු දේශය කරා ගොස් ලබා ගත් විමුක්තිය තුළ ඔවුන් නව ජීවිතයක් උදා කර ගත්හ. එහෙයින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජනතාවගෙ පව්කාරකම් උදෙසා කුරුසියේ දුක් පීඩා විඳ මරණයට පත් වී තෙවන දිනයේ උත්ථාන වීමෙන් ජනයා හට ලබා දුන් විමුක්තිය තුළ දේව රාජ්‍යය නිසි ආකාරයෙන් ලබා ගැනීමට දෙවියන් වහන්සේ කිතුනු අප සියලු දෙනා කැඳවන බව වටහාගෙන අපට හැකි උපරිමයෙන් ඒ සඳහා කැපවීමෙන් කටයුතු කරමු. එය ස්වර්ග රාජ්‍යය ලබා ගැනීමට ද හේතු වනු ඇත.

2025 වසරේ චතාරික සමය තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කිතුනු අපට අත් කර දුන් විමුක්තිය තුළ දේව රාජ්‍යය උරුම කර ගැනීමට උත්සහ කරමු. එයින් පැමිණෙන කරදර දරා ගැනීමට දෙව්පියාගේ පිහිට ආශිර්වාදය ඉල්ලා යාච්ඤා කරමු.

# විමුක්තිය ලැබෙන්නේ මරණින් පසුව ම ද?

විමුක්තිය යන වචනයෙන් අර්ථ ගැන්වෙන්නේ මුදා ගැනීම ගලවා ගැනීම වැනි අදහසකි. මිනිසුන් සැවොම විමුක්තිය ලැබූ පිරිසක් ලෙස ජීවත් වීමට ප්‍රිය කරති. නො එසේ නම් තවත් කෙනෙකු හෝ පිරිසක් විසින් තමාව යටත් කරගෙන පාලනය කර කර ගෙන සිටීම කිසිසේත් ඔරොත්තු නොදෙන්නකි. ඉන් මිදී, නිදහස් වී, ගැලවී, ජීවත් වීමට මිනිසුන් ප්‍රිය කරති.

ආගමික දෘෂ්ටියෙන් බැලූ කල මෙම විමුක්තිය යන සංකල්පය මීට එහා ගිය ගැඹුරු මතයක් නිරූපණය කරන්නකි. මිනිසුන්ට ජීවිතයේ සදාකාලිකව සතුටින් සිටින්නා වූ ක්‍රමයක් සොයා ගැනීමට වුවමනා වූ අතර ඒ සඳහා තම නැණ පමණින් ඒ මාර්ගය සොයා ගැනීමට ඔවුන් යුහුසුලු වූහ.

කිතුනු දහම තුළ විමුක්තිය පිළිබඳව වූ මාර්ගය පෙන්වා දෙන්නේ ක්‍රිස්තු රජාණන් විසින් ය. ශුද්ධ වූ බයිබලයේ උන්වහන්සේ පෙන්වා දෙන්නා වූ දැක්ම තුළ නිසියාකාරව ජීවත් වීමෙන් පසුව එම පුද්ගලයාගේ මරණයේ දී සිදු වන උත්කෘෂ්ට වූ ක්‍රියාවලියක් මගින් එම පුද්ගලයා සදාකාලික සතුට අත් කර ගනී. කිතුනු ජනයා මේ සංසිද්ධිය තුළ දැඩි විශ්වාසයේ ජීවිතයක් ගත කරති. එහෙත් මතකයේ තබා ගත යුතු වැදගත් ම දේ වන්නේ මරණයෙන් පසු ලැබෙන පාරලෞකික දිවියේ සාර්ථකත්වය රඳා පවතින්නේ වර්තමානයේ ගෙවන ඓහලෞකික (මෙලොවට අයත්) දිවියේ සාර්ථකත්වය මත බව යි.

සැබවින් ම මම ඔබට කියමි. මොවුන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුව ද අත දීමක් උපකාරයක් නො කළා නම් එය නො කළේ මම යැයි මට වදාරන සේක. මොවුහු අතහිත නො දුන් අය සදාකාලික දඬුවමට ද දැහැමියෝ සදාකාලික ජීවනයට ද යවන්නෝ ය. (මතෙව් 25:45 - 46; පරිශීලනය කර ඇත.)

ක්‍රිස්තුස් වහන්සේ සදාකාලික විමුක්තිය පිළිබඳව දර්ශනයක් ඉදිරිපත් කළ අතර උන්වහන්සේ ලොව පහළ වීමට ප්‍රථමව විමුක්තිය සොයා ගිය පිරිස් ද සිටිති. ඔවුන්ව කිතුනු දහම තුළ 'දිවැසිවරු' යන නමින් හඳුන්වයි. ඔවුන් සිදු කළේ දෙවියන් වහන්සේගේ හඬට සවන් දී ජනතාවට කිව යුතු පණිවුඩය හරියාකාරව සන්නිවේදනය කිරීම යි. දෙවියන් වහන්සේ පෙන්වා දෙන්නා වූ විමුක්ති මාර්ගයේ නිවැරදි දිශානතිය පෙන්වා දීම ඔවුන් සතු ප්‍රධාන වගකීමක් වේ. 'යෙසායා, ජෙරමියා, එසකියෙල්' වැනි ප්‍රධාන දිවැසිවරු මෙන් ම 'නාතාන්, එලියා, එලිශා' වැනි දිවැසිවරු ද මෙම සත්කාර්යයේ නිරත වූවෝ වෙති. මීට අමතරව තවත් බොහෝ දිවැසිවරු වූහ. මේ සියලු දෙනා විමුක්ති මාර්ගය කුමක් ද යන්න ප්‍රකාශ කරමින් දේව වචනය ජනතාකරණය කිරීමෙහි නිරත වූහ.

ක්‍රිස්තුස් වහන්සේ ලොව පහළ වීමට පෙර උන්වහන්සේගේ පෙර මග සලසන්නා ලෙසින් හැඳින්වූ 'ස්නාවක ජුවාම්' තුමා ද යම් ආකාරයකට විමුක්තිය සොයා යන්නකු විය. එහෙත් ඔහු නිරන්තරයෙන් පැවසූවේ තමාට පසු ලොවට වඩින පුද්ගලයාගේ වහන් පටියක් තරම් වත් තමා නොවටිනා බවත් ඒ වඩින තැනැත්තා සැබෑ විමුක්තිදායකයාණන් බවත් ය.

බුදු රදුන් ලොව පහළ වීමට පෙරත් විමුක්තිය සොයා ගියවුන් බොහෝමයක් වූහ. සිද්ධාර්ථ ගෞතමයන් ලෙස උන්වහන්සේත් ඔවුන් වෙත ගොස් විමුක්තිය සොයා ගැනීමට උත්සාහ කළහ. පස්වග මහණුන් මෙන් ම තවත් විවිධ වූ ව්‍රත අනුගමනය කරමින් විමුක්තිය සොයා ගිය පිරිස් එවකට ජීවත් වූහ.

මෙලොව ජීවත් වන කෙනෙකුට වර්තමානයේ විමුක්තිය ලබාගත හැක්කේ කෙසේ ද යන්න ගැඹුරින් ජීවිතය දෙස දකින්නෙකුට අවබෝධ කරගත හැකි ය. ගෙවෙනා සෑම මොහොතක් ම ඉතා ම සැහැල්ලු මනසින්, ක්‍රිස්තුන් වහන්සේ වදාරන්නට යෙදුණු සදුපදේශයන් තම එදිනෙදා ජීවිතය තුළින් ප්‍රගුණ කරමින් ජීවත් වීම විමුක්තිය ලැබූ ජීවිතයක ඇති සතුට සනතුෂ්ටිය ලැබුවා සේ ගත කළ හැකි ය. මන්ද එවැනි ජීවිතයක් ගත කරන තැනැත්තේ තමාට නැති දේ පිළිබඳව නලංගු නොවී තිබෙන දෙයින් තෘප්තිමත් වේ. ලද දෙයින් සතුටු වන ජීවිතය තුළ තවත් කෙනෙකු වෙත ප්‍රදානයක් කරමින් එයින් ද සන්තෘප්තියක් ලබයි. ඔවුන් එසේ ලබන සන්තුෂ්ටිය අමිල වූ පඩුරකි. මිහිපිට සිටිය දී ම විමුක්ති සුව අත්වින්දා වැනි වූ සතුටකි.

විමුක්තිය ලබා ගැනීමට දෙවියන් වහන්සේගේ

රාජ්‍යයට ඇතුළු විය යුතු යැයි විශ්වාස කෙරේ. එහි දී දෙවියන් වහන්සේගේ රාජ්‍යය මරණයෙන් පසුව ලැබෙන්නක් ලෙස යි බොහෝ අය සිතන්නේ. එහෙත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ මා අතර මේ මොහොතේදීත් පැවතිය හැකි යි. "දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඇසට පෙනෙන අයුරින් නො පැමිණෙ යි.මෙන්න මෙතන ය, අන්න අතන යැයි කිසිවකුට කිව නොහැකි ය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ අතරෙහි යැයි වදාළ සේක" (ලූක් 17:20 - 21).

බයිබලය තුළින්ද අපට පෙන්වා දෙන්නේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය අප තුළින් ම සොයා ගන්නා ලෙස යි. මේ නිසා මනුෂ්‍යයන් වශයෙන් අප සෑම දෙනෙකුගේ ම අධිෂ්ඨානය විය යුත්තේ මරණින් පසු සොයන ස්වර්ගීය සම්පත්වලට වඩා මිහිපිට ජීවත්ව සිටිය දී ම ලබන සුවය සන්තුෂ්ටිය ළඟා කර ගැනීමට යි. එවිට විමුක්තිය ලැබුවා වැනි වූ සැහැල්ලුවක් තම ජීවිතයට ලැබෙනවා නො අනුමාන යි. එම නිසා මරණින් පසු ලබන විමුක්තිය ද සැබැවට ම උරුම කර ගැනීමට මං පෙත් විවර වනු ඇත.

**ශාස්ත්‍රපති කපිල ආසිරි සිල්වා,**
**ආචාර්ය මණ්ඩලය,**
**ශාන්ත පීතර විදුහල, කොළඹ 04.**

# ක්‍රිස්තියානි පවුලේ විමුක්ති කාර්යභාරය

විමුක්තිය කවරෙකු සඳහා ද? සකල මිනිස් වර්ගයා සඳහා ය. දේවපුත්‍ර ජේසු සමිඳාණන් සකල මිනිස් වර්ගයා හට විමුක්තිය උදාකරලීම උදෙසා මිනිස් බව ගත් මහා මංගල්‍යය ලෝක කිතුනුවන් සැමරුවේ නොබෝදා ය. මිනිස් සමාජයේ මූලික ඒකකය පවුල වේ. ශු. සභා මාතාව එය ගෘහස්ථ ශු. සභාව ලෙසින් හඳුන්වනු ලැබේ. පවුලේ නිර්මාපකයාණෝ සර්වබලධාරී දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ස්වරූපයට හා සමානත්වයට මිනිසා මැවූ සේක. ආදි මවුපියන් හට උන්වහන්සේ නිදහස් කැමැත්ත ප්‍රදානය කළ බව ශු. බයිබලයේ උත්පත්ති පොත සඳහන් කරයි. ආදි මවුපියන් ලද මෙම නිදහස් කැමැත්තෙන් අයුතු ප්‍රයෝජන ගත් සාතන් ඉතා සූක්ෂම ලෙස ඔවුන් පාපයට පොලඹවා ගත්තේ ය. පාපය මිනිස් පවුල ආක්‍රමණය කළේ එලෙසින් එදා සිට ය.

**වර්තමාන මිනිස් පවුල (කුඩා ශු. සභාව)**

තම මැවුම්කරුවාණන් හට අකීකරුවීමේ මෙම මහා ඛේදවාචකයෙන් වත්මන් මිනිස් පවුල ගලවා ගැනීමේ භාරදූර කාර්යභාරය අද ශු. සභා මාතාව වෙත පැවරී ඇත. මෝසෙස්තුමන් හට දේව පියා විසින් ප්‍රදානය කරන ලද දස පනතේ සිට ජේසු සමිඳාණන්ගේ ඉගැන්වීම් මත පිහිටා ශු. සභා මාතාව විසින් සාර්ථක යහපත් ක්‍රිස්තියානි පවුල් ජීවිතයක් (සක්‍රමේන්තු ජීවිතයක්) අරභයා විවාහක පවුල් නිතිපතා දැනුවත් කරන්නී ය.

**ඊනියා විමුක්තියක් පසුපස හඹා යෑමේ විලාසිතාව හා ඵලවිපාක**

ශු. සභාව තුළ විවාහයට එළැඹෙන පවුල් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් වර්තමානය වන විට ඊනියා අඹුසැමි නිදහසේ නාමයෙන් විවාහ ජීවිත කඩාකප්පල් කරගන්නා අයුරු දැකගන්නට ලැබීම කනගාටුදායක ය. ශාරීරිකව හා මානසිකව එකිනෙකා සංවර්ධනය කිරීමේ හා එකිනෙකා ශුද්ධවන්ත කිරීමේ භාරදූර කැපවීම උදෙසා සෑම ක්‍රිස්තියානි අඹුසැමි යුවළක්ම ජීවිතාන්තය දක්වා කැඳවනු ලැබේ. උතුම් ශීල ධාර්මික ඉගැන්වීම් හා ප්‍රතිපත්ති මත මෙසේ විවාහ දිවියට ඇතුළුවන්නන් ආත්මාර්ථකාමී අනර්ථකාරී ඊනියා ස්ත්‍රී පුරුෂ විමුක්තියක් පසුපස හඹා යමින් දේව සම්බන්ධතාවය පළුදු කර ගනිමින් සමස්ත පවුල ම විනාශ මුඛයට හෙළා දැමීම කොතරම් නම් ප්‍රඥාගෝචර දැයි විමසා බැලීමට දැනටමත් කල්ගත වූවා වැඩි ය. තම ජීවන සහකරුගේ සහකාරියගේ මෙන් ම පවුල තුළ අහිංසක දරුවන්ගේ එක ම විමුක්තිදායකයා තමන් ම බව, ක්‍රිස්තියානි පවුල තුළ අඹු සැමියන් තරයේ අවබෝධ කරගන්නා තුරු මෙම භයානක තත්ත්වයෙන් පවුල මුදා ගැනීම උගහට බව අපට හැඟේ.

ලැම්බට් හා රෝස් මාලනී වාස් යුවළ,
වෙන්නප්පුව.

# LIBERATION

Shalom,

is the first address of Jesus to His disciples after the resurrection. It means peace. Jesus knew profoundly well that His disciples were greatly troubled with guilt feelings. Peter denied Him three times, a colleague betrayed Him, the rest except for one deserted Him. Jesus wanted them to forget the past and possess a clear mind free from anxiety of any sort so as to attend to the mission ahead. They needed to have complete peace of mind.

Liberation means peace. We are free to the extent that we have peace of mind and heart. When our thoughts are serene our mind is calm. We are made up of the thoughts we think and if our thoughts are free from stress it is then we are at peace.

Liberation is a very vast topic. Therefore, I wish to limit this article to personal and spiritual liberation.

Christian life is not limited to how you behave but what we believe. The key is knowing the truth. Choosing to believe the truth is the pathway to liberation. Jesus is the truth. He answered Pilot very emphatically that His mission was to witness to the truth. The truth is found in the Scriptures. Scripture is God's, own dictates.

As St Paul says "All scripture is inspired by God and profitable for teaching, for reproof, for correction and for training in righteousness (2Tim. 3:16 RSV) It is my personal view that spiritual liberation is found in the Sermon on the Mount (Mathew 5: 1-12) Jesus says, "If my word remains in you, everything will be done unto you" (John 15:7 NIV)

If we believe in Christ we are liberated and free, not because of what we are but what Jesus did. He has won for brought us liberation and salvation through the cross, and your past, present and future sinfulness can never take that salvation away from you. This very thought is enough to bring you personal peace of mind and heart and be liberated. What Jesus has done at calvary has fundamentally transformed us and has made us clean, holy and righteous. We may still fall into satan's traps time to time, but it is not who you really are deep down inside. Believe that you are absolutely secure in Him and that He is actively engaged to bring good out of even the worst circumstances of your life.

Anything worth having in life will not come that easily. All those who we call heros of the past have emerged through hardships and sufferings. Therefore, personal or spiritual liberation may not come that easily. It is a journey where glories of life such as peace, tranquility joy, truth and authentic meaning of life await you. We need to work upon it anyway. It is not difficult to achieve. If your thoughts are pure and positive then life will be meaningful and beautiful.

Nelson Mandala says, "Liberation is a wide path but it is unfortunate to notice some remain prisoners within."

Emotional liberation is achieved when we get rid of our guilty feelings, fear anger etc. When we have fear we become prisoners because fear is a wall that obstructs our forward movement and thus fear has become a common barrier to liberation and inner peace. It could be the fear of the future or failure. One should never bother about failure of any sort because it is not an end itself but a becon to success. Failure should

be a stepping stone for a better tomorrow. Never forget the fact that when one door closes for you there are many doors that open up for you to enter. Fear loses its power when confronted with determination and courage and will power. Liberation from fear unlocks infinite possibilities. We need to learn to control our thoughts and there by control our emotions. Feeling of guilt can make you a prisoner. We have already said we need not bother of our past mistakes and sins. They are all forgiven through the cross. Jesus continues to console us. Sacrament of reconciliation brings peace.

Anger can make you a prisoner too. The person who is angry suffers more than the one who he is angry with. Others may have been unjust and your being angry at their folly will not solve matters. The best way to liberate yourself here is to forgive. Forgiveness allows us to let go of the past and embark upon a future unburdened by anger or regret. Forgiveness is when you can say to your wrong doer, “Thank you for that experience” Therefore forgiveness is one of the most profound forms of emotional liberation. It is about freeing oneself from resentment towards another. Those who can forgive are strong characters. You need will power to do it. You are weak if you allow your inner peace to be disturbed by any unwholesome behaviour of another. If you do not leave your bitterness and hatred towards others behind, you would never enjoy inner liberation. Confide in you, for self confidence is a super power. Once you trust yourself, miracles happen.

Undue love for material wealth will again make you a prisoner. Happiness is not possessing everything you want but wanting things you already have. Lord Budda said “You only lose what you cling to.” Jesus said, “Why hoard things that are eaten by moths and then put into furnace?”. You are free to the extent you are able to let go of things you possess. True wealth lies in freedom from desire. You are rich to the extent that you can let alone things.


Liberation in Christ is the freedom from the power and penalty of sin. It invites all of us to live in alignment with God’s will. This freedom will empower us to walk in obedience, righteousness and joy. True freedom comes through a relationship with Jesus. When we are liberated in Christ, we are free from the world. We then are people in the world but not of the world. Spiritual freedom gives us the ability to obey God and choose His will for our lives. Jesus says that He is The Way and therefore we are spiritually liberated to the extent we are on His path. We need to allow Scripture to transform our thinking and perspective. Freedom in Christ is our internal freedom, the peace of mind and heart.

Freedom will definitely be received if we activate our faith. Recall the incident of the widow of Zarephath. She accepted Elijah’s word as coming from God and obeyed in faith and it is said that the jar of flour never used up and the jug of oil never ran dry and further her son was raised from the dead. Our active faith in Christ will definitely liberate us from lack, limitations, bondage of sin, depression and any weapon formed against us.

Life is a balance between what is under our control and what we are willing to let go. Learn to live between effort and surrender. Let Jesus be at the rudder of your life’s journey and be assured that when Jesus is in control nothing goes out of control and you are liberated.

**Christopher Perera**
St. Peter’s College,
Colombo 04 – Negombo Branch.

# කොස් කොටන්න ද...?




අපේ අත් විස වුණේ
අනෙකාට වෛරී වය
අපෙ හිත් ගෙන ආවේ
අනෙකාට නපුර ම ය


ආගමක් ඇදහුවත්
ධර්මයට පාර නැත
කාසි කොල වසාගත්
මුදල් යන්ත්‍රය වැනි ය

නායකයෝ හිටියේ ම
මුදල් ගංගාවල ය
වෛරී විය යුතු තැනත්
මැටි පිළිම යන් සේ ය

"විමුක්තිය" අකුරු පහ
විය හරි ම ලස්සන ය
යුක්තියේ කඩු කිනිසි
තිබුණාට පලක් නැත.

චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# ඕං එහෙනං



දින ගණනින් දින ගැණ ගැණ යන්නේ විස්සයි විසිපහ          ඇරඹෙන්නා
මුල මැද අග ඔහෙ යනවා යන්නට චතාරිකය ආ මඟ          පෙනෙනා
මරණය සිහිකර අළු තවරා ගෙන උපදින හැම දූවිල්ලට          හැරෙනා
ඒ බව නොසිතන සැදැහැවතුන් සැම හැමදා ඉන්නට          සැරසෙන්නා

විමුක්තියේ මඟ ගමනක් යන්නට පාදනමස්කාරය          කරනා
කයදුෂ්කාරය මල් උයනේ හඬ යටිගිරියෙන් අනේ          මුමුණන්නා
සොහොයුරු ප්‍රේමය මානව දයාව පල්ලිය මුල්ලේ කුණු          වෙන්නා
සුදුහුණු ගාගෙන සොහොන් කොත් වගෙ පල්ලියේ කණු ටික          දිලිසෙන්නා

කුරුසිය කරපිට අරගෙන යන්නට සුදු පිරුවට ඇඳ පොර          කන්නා
මහ මඟ හිඟනා රැගේ එවුන් දැක නොදැක්ක ගානට උන්          යන්නා
හැමදා එක්වරු ශීලය රකිනා උන් මීසම් සංඝය තුළ          සිටිනා
උන් ගැන ඇස් කන් වසා සිටින උන් ආගම් කණු ලෙස          හැසිරෙන්නා

ජනයට විමුක්තිය උදා කරන්නට සඳලු තලේ සිට කෑ මොර          දෙන්නා
මහ පොළොවට බැස ඇත්ත දකින්නට උන් පින්කර නැත          සොබනා
අනේ දෙයියනෙ චතාරිකෙටවත් සිත් සෝදා ගනු යුතුකම          වන්නා
එහෙම නොකළොතින් ගිනි ගෙන දැවෙනා අපායට වැටෙනුය          සොඳිනා

ලෝකය කැරකෙයි එක තැන පල්වෙයි ලෝකෝත්තරයෙන් බලනු          මනා
අහසට පොළොවට කිසිම වැඩක් නැති පින් ගුත්තරයින් බලනු          මනා
බේගල් දොඩවන පම්පෝරිය දෙන වැඩයින්ගේ හැඩ බලනු          මනා
ජේසුගේ කරටත් කුරුසිය පැටෙව්වේ ඒ වගේ අමනුන් බව          සිතෙනා

ලොවට විමුක්තිය උදා කරන්නට ජේසුස් මිහිමත පා          තැබුණා
අනේ එදින සිට එතුමා නසන්ට මාන බැලු ඒ දුෂ්ට          දනා
මහ සිකුරාදා දින උදාකර දෙමින් කුරුසිය ජේසුට හිමි          කෙරුණා
තෙදිනක් ගිය පසු මරණය පරදා විමුක්තියේ ජය ලැබ          දුන්නා

සූරිය මාමා

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



ආදර දුවේ පුතේ,

ඔන්න තරු නැන්දා ළඟ දී පොත් එළිදැක්වීමකට ගියා. පොතේ නම 'රෝස මල් කුමාරයා'. ලිව්වේ තිඹිරියාගම බණ්ඩාර ප්‍රවීණ ලේඛකයා. කවුද මේ රෝස මල් කුමාරයා කියල දැනගන්න එදා පොත මිලට අරන් ආව මම එක හුස්මට පොත කියෙව්වා. අද මම ඔයාලත් එක්ක බෙදාගන්න හදන්නෙ ඒ පොතේ එන රෝස මල් කුමාරයන් ගැන.

මේ කතාව ලියවිලා තියෙන්නෙ සත්‍යය සහ පරිකල්පනය ලස්සනට මුසු කරලා. ඒ කියන්නෙ ඇත්ත ජීවිත සිදුවීම්වලට කතුවරයාගේ කල්පනා ලෝකයෙනුත් කදිමට කාරණා පෙළ ගස්වල චරිත, සිදුවීම් ගළපල, සරල ආකර්ෂණීය භාෂා රටාවකිනුත් හැඩ ගන්වල පාඨකයා වෙතට කතාව ඉදිරිපත් කරන්න කතුවරයා සමත් වෙලා තියෙනවා.

ඉතින් කවුද මේ රෝස මල් කුමාරයා? ඇත්තට ම නම් මේ කතාවේ රෝස මල් කුමර කුමරියෝ කීප දෙනෙක් ම ඉන්නවා. රෝස සුවඳ හදවත් තියෙන මව්පිය, ගුරුවරු, වැඩිහිටි කීප දෙනෙකුත් ඉන්නවා. නුවරඑළියට විනෝද චාරිකා ගිය දුවල, පුතාල දන්නවා ඒ මඟ දෙපස ලස්සන මල් පොකුරු තියාගෙන අලෙවි කරන්න බලාගෙන ඔයාල වගේම දරුවො ඉන්නවා. ඒ අය සමහර වෙලාවට මල් පොකුරු අරන් වාහන පස්සෙන් දුවනවා.

ඒ වගේ චීන සංචාරක කණ්ඩායමක් ගමන් ගත් වාහනයක් පසුපස දුව ගිය පුතෙක්ගෙ වීඩියෝවක් පසුගිය කාලෙ ලෝකය පුරාම ජනප්‍රිය වුණා. ඒ පුතාගෙ ලස්සන හිනාව යි, මල් පොකුර යි එක්ක සිතුවම් ඇඳුණා. කවි ගී ලියැවුණා. ඒ සියලු සුන්දරත්වයන් පසුපස මේ දරුවන් තමන්ගෙ එදිනෙදා ජීවිතය පවත්වගන්න සුළු මුදලක් උපයගන්න දරන වැර වෑයම 'රෝස මල් කුමාරයා' කතාවේ පැහැදිලිව දක්වලා තියෙනවා.

කතාවේ එන එක ප්‍රධාන චරිතයක් ශ්‍රී ධරන්. ඔහු පාසල මගහැරල තමන්ගෙ පවුල වෙනුවෙන්, ආත්තම්මගෙ අසනීපවලට බෙහෙත් කරන්න මුදල් උපයන්න පාරෙ මල් විකුණනවා. නමුත් විදුහල්පතිතුමාගෙත්, ගුරුවරුන්ගෙත් උත්සාහය නිසා ඔහු ඒ මල් වෙළෙඳාම කරන අතර ම පාසල් ගිහින් අධ්‍යාපන කටයුතුත් සාර්ථක කර ගන්නවා. ඉතා ම කෙටියෙන් මම ඒ විදියට කිව්වට පොත හොයාගෙන කියෙව්වොත් ඒ ගමන කොයිතරම් දුෂ්කර වුණා ද කියල ඔයාලට දැන ගන්න ලැබේවි.

මගෙ හිත බොහොම සංවේදී කළ අනෙක් රෝස මල් කුමාරයා තමයි ෆාරිස් අල් කදෝර්. ඔහු අවුරුදු දොළහක් වයස සිරියාවේ දරුවෙක්. අඟහිඟකම් වැඩි නිසා ම මේ පවුලෙ අය තමන්ගෙ ගම, රට අත් හැරල ලෙබනනයේ බීරුට් නගරයට එනවා. ඒ එද්දි ෆාරිස්ට වයස අවුරුදු හත යි. පාසල් යාම, අධ්‍යාපනය ලැබීම සිහිනයක් ම වන බව තේරුම් ගත් ෆාරිස් එයාගෙ අයියත් එක්ක පාරෙ මල් විකුණන්න පුරුදු වෙනවා. හුරුබුහුටි හැඩරුව, ප්‍රසන්න මුදු සිනාව, ළෙන්ගතු හැසිරීම නිසා ෆාරිස් වීදියේ ජනප්‍රිය මල් අලෙවිකරුවකු බවට පත්වෙනවා. දිළිඳුකම නිසා ඇති වන කනස්සල්ල වෙනුවට ෆාරිස් මල් අලෙවි කළේ මලක් වගේම ප්‍රමුදිතව. ඒ නිසා ඔහුගෙන් මල් මිල දී ගන්න ගැනුම්කරුවො හරි ම කැමති වුණා. ඒ විතරක් නෙවෙයි ඔහුට අරාබි හෝඩිය උගන්වන්නත් ගණකාධිකාරිවරයෙක් ඉදිරිපත් වුණා. ෆාරිස්ගේ ජනප්‍රියත්වය නිසා ම ඔහු ගැන ලෙබනන් පුවත්පත්වල ලිපි පවා පළ වෙනවා. එයාට හැමෝම ආදරය කරනවා.

අත මිට මුදලක් එකතු කරගෙන ෆාරිස්, අයියත් එක්ක තමන්ගෙ නෑදෑයන් බලන්න නැවත සිරියාවට එනවා. නමුත්, සිරියාවෙදි ගුවන් ප්‍රහාරයකට හසුවන ෆාරිස් එයාගෙ ලස්සන හිනාවත් අරන් මේ ලෝකෙන් සමුගන්නවා. ඇත්ත ම කතාව නම් කුරිරු යුද්ධය ඒ සුන්දර දරුවාව අපෙන් උදුර ගන්නවා. මේ වෙද්දිත් යුද්ධය කොතරම් නම් දරුවන් බිලි ගනිමින් සිටිනවා ද?

''රෝස මල් කුමාරයා'' නුවරඑළියේ මල් විකුණන දරුවන් වගේ ම, ෆාරිස්වත් අපේ හද මනසට සමීප කරමින් කියන කතාව මොකක් ද?

- කුමන දුෂ්කරතා, බාධක ආවත් නොසැලී ජීවිතයට මුහුණ දෙන්න. ආදරෙන් ජීවත් වෙන්න.

- ඉගෙනීම අත්හරින්න එපා. ඉගෙන ගන්න පුළුවන් පාසලේ දී පමණක් නෙවෙයි. වීදියෙදිත් ඉගෙන ගන්න පුළුවන්.

- යුද්ධයට විරුද්ධ වෙන්න. මිනිස්කමට ගරු කරන්න.

'රෝස මල් කුමාරයා' පොත කියවන්න. තවත් බොහෝ දේ ඔබට ඉගෙන ගන්න ලැබේවි.

**තරු නැන්දා**

## ප්‍රහේලිකා අංක - 84

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | ■ | 3 | | | 4 | 5 | 6 |
| | ■ | 7 | | | ■ | ■ | 8 | | |
| 9 | | | ■ | 10 | | 11 | ■ | ■ | ■ |
| | ■ | | ■ | | ■ | 12 | | 13 | ■ |
| ■ | ■ | | ■ | 14 | | | ■ | | ■ |
| 15 | | ■ | 16 | | ■ | 17 | | | 18 |
| | ■ | 19 | | | ■ | | ■ | 20 | |
| 21 | | | ■ | ■ | 22 | | 23 | ■ | |
| | ■ | ■ | 24 | | | | | ■ | |
| 25 | | | ■ | ■ | 26 | | ■ | 27 | |

**පහළට**

1. සාගර ජලය මතුපිට ජලයේ අසාමාන්‍ය ලෙස උණුසුම් වීම නිසා දේශගුණික රටාවන්හි සිදු වන වෙනස් වීම.
2. "හුටු" සහ "ටුට්සි" යන ගෝත්‍ර දෙක අතර මහා ජන සංහාරයක් සිදුකරමින් යුද්ධයක් පැවති රට.
3. මොනරාගල දිස්ත්‍රික්කයේ මැණික්වලට ප්‍රසිද්ධ නගරය.
4. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමග සියලුම මිනිස් ක්‍රියාකාරකම් සිදු කරන්නට සමත් මිනිසා හා සමාන යන්ත්‍රය.
5. නැටුම්වල තාල තිස් දෙකෙන් එක් තාලයක්.
6. ලතින් ඇමරිකාවේ නාම සාන්තුවරිය.
11. "විමුක්ති දේවධර්මය" ආරම්භ වූයේ මෙහි දී ය.
13. රාජාඥාව.
15. ඇපයක් ලෙස ජීවිතයක් තබා ගැනීම.
16. යම්කිසි වස්තුවක මූල්‍යමය වටිනාකම.
18. පුද්ගලයෙකු අත්දැකීම් ලෙස මනසේ තැන්පත් කර ගෙන ඇති දේ පසුකලක නැවත සිහි කැඳවීම.
19. "දැඩි බව" යන්නට සමාන අරුත් දේ.
22. "දීප්තිය" යන්නට සමාන අරුත් දෙන නාම ප්‍රත්‍යය.
23. ධාන්‍ය වර්ගයකි.

**හරහට**

1. ක්‍රිස්තු විමුක්තියේ උපත ප්‍රථමයෙන් දැනුම් දෙනු ලැබුවේ ...................... වෙත ය.
3. එල්සැල්වදෝරයේ විමුක්තිය උදෙසා දිවි පරිත්‍යාග කළ රදගුරුතුමා.
7. එක් වතාවක්.
8. "ඇසතු" නමින් හැඳින්වෙන බෞද්ධ ධර්මයේ පූජනීය ශාක විශේෂය.
9. බුද්ධ ධර්මයේ විමුක්තිය යන්නෙන් අදහස් කරනුයේ ...................... අත්කර ගැනීම යි.
10. ගොයම්, කුරහන් ආදී ධාන්‍යවල ඇට තිබෙන කොටස.
12. ශ්‍රී ලාංකීය කතෝලික සභාවේ විමුක්ති දේවධර්මය හා සම්බන්ධව කටයුතු කළ නිර්මල මරිය නිකායික පියතුමා.
14. පෙට්ටි, ටින්, වළං ආදිය වැසීමට යොදන ආවරණය.
15. අතීතය පිළිබඳ වූ.
16. "උස" විරුද්ධාර්ථය.
17. ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ප්‍රාණ පරිත්‍යාගී වූ අවුරුදු 12 ශුද්ධවන්තිය.
19. පිහි ආදියෙහි මුවහත ඇති කොටස.
20. ස්පර්ශය හා සම්බන්ධ සංවේදන ඉන්ද්‍රිය.
21. පුටු, බංකු ආදියේ හේත්තුවන හෝ අත් තබන කොටස.
22. ධෛර්යය.
24. උතුරු ඇමෙරිකා මහාද්වීපයේ වයඹදිග අන්තයේ පිහිටි එක්සත් ජනපදවලට අයත් ජනපදයකි.
25. ඉන්දියාවේ පිහිටි පංච මහා ගංගාවලින් එකකි.
26. "අලුත්" යන්නට සමාන ය.
27. "නිර්භීත" යන්නට විරුද්ධ අර්ථ දේ.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය,
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2025 මාර්තු 31** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්**, රු.2000.00, රු.1500.00, රු.1000.00 බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 84**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර,**
**මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 82 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ස | 2 කු | 3 ට | | 4 ෆි | න් | 5 ල | න් | ත | 6 ය |
| 7 කු | රු | ස් | | | | න් | | | ටි |
| රා | | 8 මේ | 9 ව | ර | | තැ | | | පි |
| | 10 ලෙ | නි | න් | | 11 කු | රු | 12 ව | ඳු | ල |
| 13 ගී | න | යා | න | | 14 වා | ම | න | | |
| න | | 15 ව | ම | න් | ල | | 16 මී | 17 ග | ස |
| | 18 ශ්‍රී | | | | | 19 අ | | ල් | |
| 20 ජා | ති | ක | 21 ජ | 22 න | 23 බ | ල | 24 වේ | ග | ය |
| 25 ල | ය | | 26 ල | ව | ණ | | 27 ග | මු | |
| ය | | 28 ධ | ජ | ය | | 29 ණ | ය | ව | ර |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමග
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕින්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email:bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 82 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 82 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - නෙතුෂ රශ්මික, 10 ශ්‍රේණිය, සිරිකුරුස විදුහල, කළුතර.
- **දෙවන ස්ථානය** - K. සෙතුමි රදින්සා ද සිල්වා, 6 ශ්‍රේණිය B, ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය, කළුතර.
- **තෙවන ස්ථානය** - P. A. D. මිනුලි තෙසත්මා, 8 ශ්‍රේණිය, ද මැසිනොද් විදුහල, කඳාන.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2025 මැයි / ජූනි - "ඥාන පාත්‍රෙනි"**
(මැයි - ජූනි කලාපය සඳහා ඔබ එවන ලිපි මාර්තු 15ට පෙර අප වෙත එවන්න.)
**2025 ජූලි / අගෝස්තු - "වන්දනා ගමනකි"**
(ජූලි - අගෝස්තු කලාපය සඳහා ඔබ එවන ලිපි මැයි 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පුරාණ ගිවිසුම බෙදෙන ප්‍රධාන කොටස් 5න් දෙකක් සඳහන් වී ඇති පිළිතුරු කාණ්ඩය වන්නේ ?
(i) නීති පොත්/සුවිශේෂ පොත් (ii) ප්‍රඥා සාහිත්‍යය/දිවැසි ග්‍රන්ථ
(iii) හසුන්/ඉතිහාස පොත් (iv) ශුභාරංචි/නීති පොත්

(02) රූත් කතාව හා එස්තර් කතාව ජනප්‍රිය ඓතිහාසික කෘති දෙකකි. ඒවා අයත් වන්නේ ?
(i) සීනයි ගිවිසුමට (ii) නව ගිවිසුමට (iii) පුරාණ ගිවිසුමට (iv) පාවුළු තුමාගේ ලිපිවලට

(03) කතෝලික ධර්මයේ පදනම වන්නේ ?
(i) දේවස්ථානය යි. (ii) වන්දනා ගමන් ය. (iii) ශුද්ධවන්තයින් ය. (iv) දේව වචනය යි.

(04) ක්‍රි.ව. 64 - ක්‍රි.ව. 66 කාලයේ දී ලේඛන ගත වූ නව ගිවිසුමේ මුල් ම ශුභාරංචිය නම් කරන්න.
(i) ශු. මාක් ශුභාරංචිය (ii) ශු. ලූක් ශුභාරංචිය
(iii) ශු. මතෙව් ශුභාරංචිය (iv) ශු. ජොහාන් ශුභාරංචිය

(05) ශ්‍රීමත් තියෝපිලස් තුමන්ට තම ග්‍රන්ථය පිළිගැන්වූයේ කවුරුන් ද ?
(i) ජොහාන් තුමා (ii) පාවුළු තුමා (iii) ජාකොබ් තුමා (iv) ලූක් තුමා

(06) ග්‍රීසියේ "අක්කායා" ස්ථානයේ දී රචනා වී ඇති පොත වන්නේ ?
(i) එළිදරව්ව පොත (ii) ක්‍රියා පොත (iii) ලූක් ශුභාරංචිය (iv) ගණන් කතාව

(07) විවිධ සංඝවලට හා පුද්ගලයන්ට ලිපි ලියූ පුද්ගලයෙකි.
(i) ශු. ජාකොබ් තුමා (ii) ශු. පිලමොන් තුමා (iii) ශු. ලූක් තුමා (iv) ශු. පාවුලු තුමා

(08) නව ගිවිසුමේ වෙනත් සංදේශ ලියූ අපෝස්තුලුවරුන් සඳහන් වන නිවැරදි පිළිතුර සොයන්න.
(i) ජාකොබ් තුමා/මතෙව් තුමා (ii) ජොහාන් තුමා/ජූද් තුමා
(iii) ජොහාන් තුමා/ලූක් තුමා (iv) ජූද් තුමා/පිලිප්පි තුමා

(09) ඉරුදින දිව්‍ය පූජාවේ දෙවන කියවීම සඳහා භාවිත කරන්නේ කාගේ සංදේශ ද ?
(i) පේදුරු තුමාගේ (ii) ජොහාන් තුමාගේ (iii) පාවුලු තුමාගේ (iv) ජාකොබ් තුමාගේ

(10) දේව ආදරයේ ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ හා අපගේ ගැලවීමේ සංකේතය කුමක් ද ?
(i) කුරුසිය (ii) බැටළු පැටවා (iii) ශ්‍රී සළුව (iv) හදවත

(11) එළිදරව්ව ග්‍රන්ථයේ කතෘත්වය ආරූඪ කර ඇති අපෝස්තුලුවරයා නම් කරන්න.
(i) ඇන්ඩෘ අපෝස්තුලුවරයා (ii) ජොහාන් අපෝස්තුලුවරයා
(iii) පේදුරු අපෝස්තුලුවරයා (iv) ජාකොබ් අපෝස්තුලුවරයා

(12) පැරණි ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය කුමක් ද ?
(i) හොක්මා (ii) රාදා (iii) රොසෝරියම් (iv) අබාද්

(13) විශ්වයේ හා මිනිසාගේ ආරම්භය ගැන සඳහන් වන්නේ කුමන පොතේ ද ?
(i) ගණන් කතාව පොතේ (ii) නික්මයාම පොතේ
(iii) උත්පත්ති පොතේ (iv) ලෙවී ව්‍යවස්ථාව පොතේ

(14) ඉශ්‍රායෙල් ජනතාවගේ කාන්තාර ගමන ගැන සඳහන් වී ඇති පොත නම් කරන්න
(i) ගණන් කතාව පොත (ii) උත්පත්ති පොත
(iii) නික්මයාම පොත (iv) ද්වීතිය නීති සංග්‍රහය පොත

(15) "ටෝරා" යන්නෙහි අර්ථය වන්නේ කුමක් ද ?
(i) බෙදා ගැනීම (ii) ආදරය (iii) ව්‍යවස්ථාව (iv) ගුරුවරයා

(16) නෝවා සමග ගිවිසුම සිද්ධිය අයත් සම්ප්‍රදායය වන්නේ ?
(i) J සම්ප්‍රදාය යි (ii) P සම්ප්‍රදාය යි (iii) E සම්ප්‍රදාය යි (iv) D සම්ප්‍රදාය යි

(17) සෙප්ටුවාජින්තය යන්නෙහි අර්ථය කුමක් ද ?
(i) හත (ii) දාහත (iii) හැත්තෑ හත (iv) හැත්තෑව

(18) දෙවියන් වහන්සේ දර්ශන හා සිහින තුළින් මිනිසාට කතා කරන ලද්දේ කුමන සම්ප්‍රදාය තුළ ද ?
(i) J සම්ප්‍රදාය (ii) E සම්ප්‍රදාය (iii) P සම්ප්‍රදාය (iv) D සම්ප්‍රදාය

(19) හීබෲ පිටපත බිහිවූයේ කුමන මූලාශ්‍රය මඟින්ද ?
(i) රෝම මූලාශ්‍රයෙන් (ii) ග්‍රීක මූලාශ්‍රයෙන්
(iii) ජුදා මූලාශ්‍රයෙන් (iv) ලතින් මූලාශ්‍රයෙන්

(20) 'මෙන්න මම මෙහි ය. මා යැව්ව මැනව' යනුවෙන් තම කැඳවීමට පිළිතුරු දුන් දිවැසිවරයා කවුරුන් ද?
(i) ජෙරමියා (ii) යෙසායා (iii) එසකියෙල් (iv) දානියෙල්

**පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| (01) ii | (02) iii | (03) iv | (04) i |
| (05) iv | (06) ii | (07) iv | (08) ii |
| (09) iii | (10) i | (11) ii | (12) i |
| (13) iii | (14) i | (15) iii | (16) ii |
| (17) iv | (18) ii | (19) iii | (20) ii |

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම VIII
## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්
## සුබාරංචිය වර්ගීකරණය

මතෙව් හා මාර්ක් සුපුවත් සම්බන්ධව පසුගිය කලාපයේ සාකච්ඡාවට භාජනය විය. මෙවර ශු. ලූක් සහ ශු. ජොහාන් තුමන්ගේ සුපුවත් සම්බන්ධයෙන් අධ්‍යයනයේ යෙදෙමු.

ශුද්ධවර ලූක් සුබාරංචිය

එම සුබාරංචිය විශේෂයෙන් ම යොමු වී ඇත්තේ සමාජ දේහයේ දුක් විඳින, කොන් වූ ජනතාව වෙත ය. මානවවාදී සුපුවතකි. බොහෝ කරුණු ඉදිරිපත් කර ඇත්තේ කථාන්තර රූපී විලාශයකිනි. එඬේරුන්, කාන්තාවන්, පව්කරුවන්, ධීවරයන්, අන්‍ය ජාතිකයන් යන සමාජය ප්‍රතික්ෂේප කරමින් කොන් කරන ලද්දාවුන් වෙත සුබාරංචිය යොමු වී ඇත. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මානව ගැලවීම ජුදාවරුන් සඳහා පමණක් නොව සියලු ජාතීන් සඳහා ම වන බව එම සුපුවත අනාවරණය කරයි. උන්වහන්සේගේ දූත මෙහෙවරේ බොහෝ උපමා යොදාගෙන ඇත්තේ ද කොන් වූ ජනතාව වෙත ය. උදාහරණ ලෙස යහපත් සමරිතානුවා, නැතිවූ බැටළුවා, නැතිවූ කාසිය, නැතිවූ පුත්‍රයා පෙන්වා දිය හැක. එසේම ක්‍රිස්තුස් වහන්සේගේ උපත ප්‍රථමයෙන් ම දැනුම් දෙන්නේ එඬේරුන් වෙත ය. එඬේරුන් යනු කොන් කරන ලද පිරිසකි.

රචනා වූ ප්‍රදේශය සහ කාලවකවානු

රෝමවරු සහ ජුදාවරුන් අතර කැරැල්ල සිදු වුයේ ක්‍රි.ව. 70-71 අතර කාලයක ය. එම කැරැල්ලේ දී රෝමවරු ජෙරුසලම විනාශකර ඇත. කැරැල්ල සම්බන්ධව තොරතුරු ලූක් සුපුවත අනාවරණය කරන්නේ නැත. එම නිසා සුබාරංචිය ලියවෙන්නට ඇතැයි සැලකිය හැක්කේ ක්‍රි.ව. 80-90 අතර කාලයක යැයි විශාරද මතය වේ. ලූක් තුමා පාවුලු තුමන් සමග ධර්මදූත චාරිකා සඳහා සම්බන්ධ වී ඇත. ධර්මදූත කටයුතු සඳහා රෝමයට පැමිණි අවස්ථාවේ දී රෝමයේ අකයියාව යන නගරයේ දී සුපුවත ලියා ඇතැයි විශාරද මතය වේ.

කර්තෘත්වය

ලූක් තුමා සිරියාවේ අන්තියෝකියෙන් පැමිණි ජුදා ජාතිකයකු නොවන වෛද්‍යවරයෙකි. සිරියාවේ අන්තියෝකිය රෝම අධිරාජ්‍යයේ තෙවන විශාල නගරය වේ.

මර්මූලියන්, ඉරේනියස්, ඔරිගන්, යුසේබියස් හා ජෙරොම් නැමැති සභා පියවරු පෙන්වා දෙන්නේ ලූක් තුමා පාවුලු තුමන්ගේ සහයට සිටි සේවකයෙකු බව යි. ලූක් සුපුවත හ අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත යන පොත් දෙක ම ලූක් තුමා රචනා කර ඇති බවට විශාරද මතයකි. මුල් ක්‍රිස්තියානි සභාවට 'ක්‍රිස්තියානි' යන නාමය ප්‍රථම වතාවට භාවිතා වූයේ ද සිරියාවේ අන්තියෝකියේ දී ය.

ලූක් තුමා තම ගුරුවරයා වූ ශ්‍රීමත් තියෝපිලස් තුමන්ට එම ග්‍රන්ථය පිළිගන්වා ඇත. තියෝපිලස් යන ග්‍රීක් වදනේ අර්ථය වන්නේ "දෙවිඳුන්ගේ ආදරය ලැබූ තැනැත්තා" යන්න ය.

සුබාරංචිය රචනා කිරීමේ පරමාර්ථය

එම පොත රචනා කිරීමේ පරමාර්ථය වන්නේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමාජයෙන් කොන් කරනු ලැබුවන් වෙත මානව දයාවෙන් හා කරුණාවෙන් ගැලවීම සලසා දෙන බවත් ක්‍රිස්තුස් වහන්සේගේ ගැලවීම විශ්වීය ජනතාවට පොදු බවත් පෙන්වා දීම ය.

ලූක් සුපුවතට ආවේණික ලක්ෂණ

1. ජේසුස් වහන්සේගේ මෙහෙයේ අරමුණ වූ දිළිඳුනට සුබාරංචිය දේශනා කිරීම, අන්ධයනට පෙනීම ලබා දීම, වහලුන් මිදීම, ක්‍රිස්තුස් වහන්සේගේ දූත කාර්යය බව පෙන්වීම.
2. සමාජය ප්‍රතික්ෂේප කළ ජන කොටස්වලට දයානුකම්පාව දැක්වූ මනුෂ්‍ය පුත්‍රයෙකු බව පෙන්වීම.
3. ඕනෑම අයෙකු ක්‍රිස්තුස් වහන්සේව පිළිගෙන මනස්ථාපනය වන්නේ නම් ගැලවීම උරුම වන බව පෙන්වා දීම.
4. ක්‍රිස්තුස් වහන්සේ දිව්‍ය වෛද්‍යවරයා ලෙස

බොහෝ රෝගීන් සුව කළ බව පෙන්වීම.

5. ලූක් තුමාගේ භාෂා ශෛලිය සෙප්තුවාජින්ත පිටපතේ භාවිත වූ 'කොයිනේ' (ග්‍රීක) බස යි. මෙම පොත සඳහා ද එම භාෂා ශෛලිය භාවිත වී ඇත.

<u>ශුද්ධවර ජොහාන් තුමාගේ සුබාරංචිය</u>

ජොහාන් සුපුවත සමදර්ශක සුබාරංචිවලට වඩා වෙනස් ස්වරූපයක් ගනී. එම සුබාරංචිය රචනා වී ඇත්තේ ජොහානිය සංඝය සඳහා වූ අත්පොතක් ලෙසය. එමනිසා වෙනම රටාවක් අනුගමනය කර ඇත.

<u>රචනා වූ කාලවකවානු හා ප්‍රදේශය</u>

මෙතෙක් හමුවී ඇති නව ගිවිසුමේ ඉපැරණි අත්පිටපත ක්‍රි.ව. 110-125 අතර කාලයට අයත් ජොහාන් සුබාරංචියේ පිටපත යි. එසේ නම් සුබාරංචිය රචනා කිරීම එම කාලයට පෙර සිදු විය යුතු ය. බොහෝ විශාරද මතය වන්නේ ක්‍රි.ව. 90-100 අතර කාලයේ ලියැවුණු බව ය. එපීසිය නගරයේ දී එය රචනාවූ බවට පෙන්වන සාක්ෂි ඇත. තවත් විශාරද මතයක් වන්නේ පළමුවන සියවස අගභාග යේ හෝ දෙවන සියවස මුල්භාගයේ කිතුනුවන් පීඩා විඳි සමයක එම පොත රචනා වන්නට ඇති බව ය.

<u>කර්තෘත්වය</u>

කර්තෘත්වය සම්බන්ධව විවිධ මත පවතී. ඒ අනුව ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා ජොහාන් බවට එක් මතයකි.

තවත් මතයක් වන්නේ සෙබදිගේ පුත් ජාකොබ්ගේ සහෝදරයා ශු.ජොහාන් බවත් ඔහු ජේසුස් වහන්සේගේ සිදුවීම් ඇසින් දුටු අයෙකු බව ය.

අයිරේනියස් නැමැති සභා පීතෘවරයා පෙන්වා දෙන්නේ ජොහාන් ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු බවත් එපීසියේ දී සුබාරංචිය රචනා කළ බවත් ය.

කෙසේ වෙතත් බොහෝ විශාරද මතය වන්නේ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ, ප්‍රේම කළ ශ්‍රාවකයා ලෙස හැඳින් වූ ජොහාන් මෙම සුපුවතේ කර්තෘ බව ය.

<u>සුබාරංචිය රචනා කිරීමේ පරමාර්ථ</u>

ප්‍රධාන පරමාර්ථය වුයේ ක්‍රිස්තු භක්තිකයන්ගේ ආගමික හා ආධ්‍යාත්මික අවශ්‍යතාව සම්පූර්ණ කිරීම යි. ඇදහිල්ල තුළින් සදාතන ජීවිතය උරුම කරගැනීමට හැකි බව පෙන්වාදීම තවත් පරමාර්ථයකි. ඒ හා සම්බන්ධ වූ අනු පරමාර්ථ 3කි.

1. ක්‍රිස්තුස් වහන්සේ මෙසියස් තුමන් බව තහවුරු කිරීම
2. ජුදාවරු තුළ ස්නාවක ජුවාම් තුමා මෙසියස් බවට වැරදි මතයක් තිබුණි. එම වැරදි මතය දුරු කිරීම හා ක්‍රිස්තුස් වහන්සේගේ මෙසියානු අනන්‍යතාව තහවුරු කිරීම
3. ක්‍රිස්තු භක්තිකයන් ඇදහිල්ල තුළින් ධෛර්යවත් කිරීම

<u>ජොහාන් සුපුවතට ආවේණික ලක්ෂණ</u>

1. ක්‍රිස්තුස් වහන්සේ කවරෙක්දැයි තහවුරු කිරීමට දැඩි උත්සහයක් දරා ඇත.
2. සැම විට ම ආමන්ත්‍රණය කරන්නේ ජුදා සන්දර්භය වෙත ය.
3. ගැඹුරු දේවධාර්මික පදනමක් මත පිහිටා සුබාරංචිය රචනා වී ඇත.
4. සමදර්ශක සුබාරංචි ප්‍රාතිහාර්යයන් හැඳින්වූයේ "පුදුම ක්‍රියා" ලෙස ය. ජොහාන් පොතේ ඒවා හඳුන්වන්නේ 'සලකුණු' ලෙස ය. ඒ සඳහා ග්‍රීක් බසින් "සෙමෙයියොන්" යන වදන භාවිත කරයි. "මම වෙමි" යනුවෙන් ස්වයං අනාවරණ ඉදිරිපත් කරයි.

උදා:-

"ජීවනදායක භෝජනය මම වෙමි"

"යහපත් බැටළු එඬේරා මම වෙමි"

"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි"

සුබාරංචි කතුවරුන් ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධව සුපුවත ජනතා ගත කිරීමට බොහෝ උත්සහ දරා ඇත.

සුබාරංචිය යනු ක්‍රිස්තුස් වහන්සේ ය. එහි ආලෝකය දසත ව්‍යාප්ත කිරීම ධර්මදානය යි. කිතුනු ඉගැන්වීම් තුළ දිවි ගෙවීම දේව ජනතාවගෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන සේක.

සටහන : ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා

RESIDENTIAL - COMMERCIAL - INDUSTRIAL

# UNITED PROFESSIONALS AGENCIES

වසර 25 කට වඩා වැඩි ක්ෂේත්‍රයේ පළපුරුදු
බලපත්‍රලාභී ආයතනයකි.



# කරදරකාරී පලිබෝදකයන් මර්දනය

## PROVIDE ALL TYPES OF PEST CONTROL SERVICES

දිවයින පුරා සේවාව සපයයි.

- නිවාස
- නව ඉදිකිරීම්
- පාසල්
- හෝටල්
- කර්මාන්තශාලා
- ව්‍යාපාරික ස්ථාන




- *LICENSED & INSURED*
- *FAST RESPONSE*
- *24 HOURS EMERGENCY SERVICES*
- *PROFESSIONAL WORKS*

**CALL US TODAY**

**071-5362618 / 071-5362624**

No, 740, Thorana Junction, Wedamulla, kaleniya.

Made with PosterMyWall.com

## ශ්‍රී ලංකාවේ ඉපැරණිම

# මග්ගොන ජාතික කල්වාරි පුදබිම

## 125 ජුබිලි වසර (1900 - 2025)

## කුරුසිය මගින් විමුක්තිය කරා...

## 125 වන ජුබිලි මහා මංගලෝත්සවය

**රදගුරු හිමිපාණන්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අප්‍රි. 26 පෙ.ව. 8.00 ට පැවැත්වේ.**


**2025 මාර්තු 05 අළු බදාදා සිට අප්‍රේල් 20 පාස්කු ඉරිදා දක්වා**
**වැඩ පිළිවෙල**

### සෑම සිකුරාදා දිනවල:

ප.ව. 4.00 - පොදු පාදනමස්කාරය සහ දිව්‍ය පූජාව

### සෑම සෙනසුරාදා, ඉරිදා සහ ප්‍රසිද්ධ නිවාඩු දිනවල:

පෙ.ව. 9.30 - පොදු පාද නමස්කාරය (නි.ම.නි. පියවරුන්ගේ මෙහෙයවීමෙන්)
පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාපොච්චාරණය ඇසීම
මධ්‍යාන 12.00 - පසන් ගායනා
ප.ව. 12.30 - දිව්‍ය පූජාව



### අප්‍රේල් 18 මහා සිකුරාදා

පෙ.ව. 10.00 - මහා පාද නමස්කාරය
ප.ව. 02.00 - ශ්‍රී වාක්‍ය හත මෙනෙහි කිරීම් සමඟ තුන් පැය ධ්‍යානය

### අප සේවාවන්:

**පාද නමස්කාර** (සිංහල, දමිළ, ඉංග්‍රීසි)
**දිව්‍ය පූජාවන්** (සිංහල, දමිළ සහ ඉංග්‍රීසි)
**පාපොච්චාරණය** (සිංහල, දමිළ සහ ඉංග්‍රීසි)
**ළමා සහ තරුණ චතාරික වැඩ සටහන්**
**පවුල් සඳහා නේවාසික ධර්ම විවේකයන්**
**සති අන්ත විශේෂ යැදුම් මෙහෙයන් සහ පසන් ගායනා**
**පියතුමෙකු හා සමඟ ජීවිත ගැටළු බෙදා ගැනීමට අවස්ථා**

**අනෙකුත් පහසුකම්:**
* රථ ගාල්
* නවාතැන් පහසුකම්
* ආහාරපාන පහසුකම් (දිවා/රාත්‍රී ආහාර සඳහා ඇනවුම් බාරගනු ලැබේ)

**ගමන් මාර්ග:**

| | |
|---|---|
| කොළඹ දෙසින් | : දක්ෂිණ අධිවේගී මාර්ගයේ දොඩංගොඩ අන්තර් හුවමාරුව - කටුකුරුන්ද මංසන්දිය - මග්ගොන (මඩම පාර) |
| මාතර දෙසින් | : දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැලිපැන්න අන්තර් හුවමාරුව - අළුත්ගම - මග්ගොන (මඩම පාර) |
| බස් මාර්ගය | : ගාලුපාර - දියළගොඩ හන්දිය - මඩම පාර |
| දුම්රිය මාර්ගය | : මග්ගොන දුම්රිය ස්ථානය (දකුණු පයාගල සහ බේරුවල අතර) |

### සියළු විමසීම්:


**ගරු ජූඩ් සපරමාදු නි.ම.නි. පියතුමා - 076 2235048**
**ගරු සුසිත් රන්දිල් නි.ම.නි. පියතුමා - 071 1584483**
**ගරු ධනුෂ්ක ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා - 071 2514018**
**ගරු ශානිල් දිනුක නි.ම.නි. පියතුමා - 070 1668315**
**ගරු ශාලින්ද ලක්මාල් නි.ම.නි. පියතුමා - 070 1415425 (ආහාර ඇනවුම් සඳහා)**



මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025